# වාර්ෂික කාර්ය සාධන වාර්තාව

# செயலாற்றுகை அறிக்கை 2015

# ANNUAL PERFORMANCE REPORT

Our Intention Your Protection

DPCCS


## පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව

බී කොටස, 3 වන මහල, සෙත්සිරිපාය II වන අදියර, බත්තරමුල්ල.

## நன்னடத்தை, சிறுவர் பராமரிப்புச் சேவைகள் திணைக்களம்

பீ பிரிவு, 3 ஆம் மாடி, செத்சிறிபாய கட்டம் II, பத்தரமுல்லை.

## Department of Probation and Child Care Services

Section B, 3rd Floor, Stage II, Sethsiripaya, Battaramulla.

# වාර්ෂික කාර්ය සාධන වාර්තාව - 2015


පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව

බී කොටස, 03 වන මහල, සෙත්සිරිපාය II වන අදියර, බත්තරමුල්ල

# 1. හැඳින්වීම

2015 වර්ෂයේ දී පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව විසින් ඉටුකරන ලද සේවාවන් මෙම වාර්තාවෙන් සමාලෝචනය කෙරේ.

## 1.1 දෙපාර්තමේන්තු ඉතිහාසය

වර්ෂ එක්දහස් නවසිය තිස් ගණන්වලදී ශ්‍රී ලංකාවේ අධිකරණය විසින් පරිවාස ක්‍රමය අත්හදා බැලීමක් වශයෙන් ක්‍රියාත්මක කරනු ලැබීය. 1907 දී එංගලන්තයේ සම්මත කරන ලද වරදකරුවන් පිළිබඳ පරිවාස ආඥා පනත ලංකා අධිකරණය කෙරේ ද බලපෑවේය. වර්ෂ 1944 දී සම්මත කරන ලද අංක 22 දරණ පරිවාස ආඥා පනත ඉහත සඳහන් කළ බලපෑම් වල ප්‍රතිඵලයක් විය. මෙම ආඥා පනත තුලින් පරිවාස ක්‍රමය ලංකා අධිකරණයේ ස්ථාපිත විය.

එංගලන්තයේ පරිවාස සේවාව ඇසුරින් ලංකාවේ ද පරිවාස සේවාවන් ආරම්භ කිරීමේ කාර්යභාරය එංගලන්තයේ උපදේශකයෙකු වන එච්.ඒ.ලීඩීන් මහතාට පැවරුණු අතර, ඒ අනුව බන්ධනාගාර දෙපාර්තමේන්තුව හා සම්බන්ධ පරිවාස සේවාව පරිවාස නිලධාරීන් කීපදෙනෙකුගෙන් ආරම්භ විය. අත්හදා බැලීමක් ලෙස දිවයිනේ අධිකරණ කොට්ඨාශ කීපයක පමණක් ක්‍රියාත්මක කිරීමෙන් පසු මෙම සේවය අධිකරණය විසින් පිළිගනු ලැබීය. ඉන්පසු එය වැඩිදියුණු කිරීමේ අවශ්‍යතාවය ද ඉස්මතු විය.

1949 දී විනිශ්චයකාර ශ්‍රේෂියන් මහතාගේ ප්‍රධානත්වයෙන් පත්කරන ලද කමිටුවේ නිර්දේශ රජය විසින් පිළිගනු ලැබීමත් සමඟ දිවයින පුරා සියළුම අධිකරණ කලාප ආවරණය වන පරිද්දෙන් පරිවාස සේවය ව්‍යාප්ත කෙරිණ. මෙම සේවාවේ පරිපාලන කටයුතු කරන ලද්දේ බන්ධනාගාර හා පරිවාස දෙපාර්තමේන්තුව විසිනි.

ළමයින් හා යෞවනයන් පිළිබඳ ආඥා පනත ක්‍රියාත්මක කිරීම හා ළමා උසාවි ආරම්භ කිරීමත් සමඟම ළමයින් සඳහා සැපයෙන සේවාවන් එක්තැන් කිරීමේ වැදගත්කම පිළිබඳව සිරිල් හැම්ලීන් මහතාගේ වාර්තාවෙන් පෙන්වා දෙන ලදී. එම නිර්දේශය අනුව 1956 ඔක්තෝම්බර් 01 දින පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව ආරම්භ විය.

මෙසේ 1956 දී ආරම්භ වූ දෙපාර්තමේන්තුව මුලින්ම සමාජ සේවා අමාත්‍යාංශය යටතට පත්විය. පසුව පත් වූ රජයන් විසින් වරින් වර විවිධ අමාත්‍යාංශ යටතට පත් කරන ලදී. 1990 වසර ආරම්භයේ දී එය ප්‍රතිසංස්කරණ පුනරුත්ථාපන හා සමාජ සුභසාධන අමාත්‍යාංශය යටතේ ද, 1994 අගෝස්තු මාසයෙන් පසුව සෞඛ්‍ය මහා මාර්ග හා සමාජ සේවා අමාත්‍යාංශය යටතේ ද, 2001 වර්ෂයේ දි සමාජ සේවා හා ධීවර ප්‍රජාවගේ නිවාස සංවර්ධන අමාත්‍යාංශය යටතේ ද, 2002 දී සෞඛ්‍ය පෝෂණ හා සුභසාධන අමාත්‍යාංශය යටතේ ද, 2003 දී සමාජ සුභසාධන අමාත්‍යාංශය යටතේ ද, 2004 වර්ෂයේ දී කාන්තා අභිවෘද්ධි හා සමාජ සුභසාධන අමාත්‍යාංශය යටතේ ද, 2005 වර්ෂයේ සිට ළමා සංවර්ධන හා කාන්තා අභිවෘද්ධි අමාත්‍යාංශය යටතේ ද කටයුතු සිදු කෙරිණි. 2010 වර්ෂයේ සිට ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශය යටතේ ද, 2015 සිට කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය යටතේ ද දෙපාර්තමේන්තුවේ කටයුතු සිදු කෙරේ.

## 1.2 පළාත් සභා පිහිටුවීම සහ දෙපාර්තමේන්තුවේ බලතල

පරිවාස හා ළමාරක්‍ෂක සේවා දෙපාර්තමේන්තුව ආරම්භ වීමෙන් පසු, රැඳවුම් නිවාස, සහතික කළ පාසැල්, පරිවාස කාර්යාල ඇතුළු අනෙකුත් ආයතන වල කටයුතු පරිවාස දෙපාර්තමේන්තුව යටතේ ව්‍යාප්ත වූ අතර මුළු දිවයිනම ආවරණය වන පරිදි සහකාර කොමසාරිස්වරුන් ද පරිවාස හා ළමාරක්‍ෂක සේවා කොමසාරිස්ට සහායවීම සඳහා පත් කෙරිණි.

1987 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනය ක්‍රියාත්මක වීමත් සමඟ එම ව්‍යුහය වෙනස් වූ අතර පරිවාස හා ළමාරක්‍ෂක සේවය පළාත් සභාවලට විමධ්‍යගත කරන ලදි. ඒ සමඟම මෙතෙක් කොමසාරිස්ට සහාය වීම සඳහා පත්කර සිටි සහකාර කොමසාරිස් තනතුරුද අහෝසි විය.

පළාත් සභා යටතේ පළාත් පරිවාස හා ළමාරක්‍ෂක සේවා කොමසාරිස්වරුන් සියළු පළාත් වෙනුවෙන් පත් වූ අතර පරිවාස කාර්යාල ඔවුන්ගේ අධීක්‍ෂණයට යටත් විය.

1991 වර්ෂයේ දී ශ්‍රී ලංකාව ළමා අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශයට අත්සන් තැබූ අතර 1992 වර්ෂයේ දී ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තිය ප්‍රකාශයට පත් කරන ලදී. එම ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තියෙහි වූ ව්‍යවස්ථාවන් ක්‍රියාත්මක කිරිමේ අවශ්‍යතාවය වෙනුවෙන් 1999 වර්ෂයේ දී දෙපාර්තමේන්තුව විසින් ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරින් ලෙස සිය ක්ෂේත්‍ර රාජකාරී ඉටුකර ගැනීම අරමුණු කර ගනිමින් නව තනතුරක් නිර්මාණය කර ඊට නිලධාරීන් බඳවා ගන්නා ලදී. මේ වන විට මෙම නිලධාරීන් දිවයින පුරාම පිහිටි දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට අනුයුක්තව කටයුතු කරනු ලබයි. මෙමගින් පරිවාස විෂයය මෙන්ම ළමාරක්‍ෂක විෂයයටද මූලිකත්වය ලබාදී වැඩසටහන් දියත් කෙරේ.

## 1.3 අපගේ දැක්ම

ළමුන්ගේ අයිතීන් තහවුරු වූ ඔවුනට සංවේදී හිතකර සමාජයක්

## 1.4 අපගේ මෙහෙවර

ජාතික ප්‍රතිපත්තීන් හා ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව අනාථ, අත්හල හා අසරණ ළමයින් ද, නීතිමය ගැටළුවලට බඳුන් වූ ළමයින් ද, සුවිශේෂී කර ගනිමින් සියළුම ළමුන් ගේ අයිතිවාසිකම් තහවුරු කරමින් ඔවුනට සමාන අවස්ථාවන් උදා කරදීම.

## 1.5 අපගේ අගයයන්

- දරුවා කේන්ද්‍ර කොට ගැනීම
- දයාව / කරුණාව පෙරදැරි කර ගැනීම
- සහයෝගී ප්‍රවේශය
- මනා කැපවීම
- සංහිඳියාව

## 1.6 අපගේ කැපවීම

- නීතිය සමඟ ගැටුම් ඇති කර ගත් දරුවන් පුනරුත්ථාපනය
- අනාථ, අත්හල හා අසරණ දරුවන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමට ක්‍රියා මාර්ග ගැනීම
- නීතිමය ගැටලු වලට ලක් වූ ළමුන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම
- ළමා අයිතිවාසිකම් ප්‍රවර්ධනය සහ තහවුරු කිරීම සඳහා වූ ක්‍රියාමාර්ග ගැනීම
- අදාල අමාත්‍යාංශ හා පළාත් සභා සම්බන්ධීකරණය කරමින් ඔවුන්ගේ නිර්දේශ මත ළමා අයිතිවාසිකම් සම්බන්ධව දැනට පවතින අණ පනත් ජාතික හා අන්තර්ජාතික ප්‍රමිතීන්ට අනුකූල වන පරිදි සංශෝධනය කිරීම
- පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තු වලට අවශ්‍ය අවස්ථා වලදී තාක්ෂණික දැනුම හා නීති උපදෙස් ලබා දීම
- නීතිය සමඟ ගැටුම් ඇති කර ගත් දරුවන් පුනරුත්ථාපනයට අවශ්‍ය යටිතල පහසුකම් සැලසීම
- පවතින අභ්‍යන්තර වත්කම් හා කළමනාකරණ ක්‍රමයන් වැඩිදියුණු කිරීම
- ජනතා අවශ්‍යතා තෘප්තිමත් වන ආකාරයෙන් කාර්යක්ෂම සේවාවක් සැපයීම
- කාර්යක්ෂමව ළමා අයිතිවාසිකම් සුරැකීමට හැකි මනා කාර්ය මණ්ඩලයක් පුහුණු කිරීම

## 1.7 වැඩසටහන්

- ❖ පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තු සමඟ සම්බන්ධීකරණය
- ❖ විදේශීය හදාවඩා ගැනීම්
- ❖ ළමුන් ගේ අධ්‍යාපන අයිතීන් තහවුරු කිරීම සඳහා වූ වැඩසටහන්
    - *සෙවණ* සරණ කැපකරු මාපිය ක්‍රමය මඟින් අසරණ ළමයින්ට අවශ්‍ය සහන සැලසීම
    - නැණ දිරිය ශිෂ්‍යත්ව වැඩසටහන යටතේ සහන ක්‍රියාත්මක කිරීම
    - කැපකරු දෙගුරු ආධාර ක්‍රමය මඟින් ළමයින්ට අධ්‍යාපන ආධාර ලබා දීම
- ❖ ළමා අයිතිවාසිකම් තහවුරු කිරීම වෙනුවෙන් සමාජ ව්‍යුහයන් බල ගැන්වීම
- ❖ ළමුන්ගේ සහභාගිත්ව අයිතිය තහවුරු කිරීම උදෙසා ළමා සමාජ හා ළමා සභා වැඩසටහන ක්‍රියාත්මක කිරීම
- ❖ පුහුණු හා පර්යේෂණ කටයුතු
- ❖ උපදේශනය අවශ්‍ය, නීතිය සමඟ ගැටුම් ඇති කර ගත් දරුවන් වෙනුවෙන් පරත්ත ළමා පුහුණු හා උපදේශන සේවා ජාතික මධ්‍යස්ථානය පවත්වාගෙන යාම

## 1.8 දෙපාර්තමේන්තු සංවිධාන ව්‍යූහය හා කාර්ය මණ්ඩලය යෙදවීම

ශ්‍රී.ලං.ප.සේවයට අයත් නියෝජ්‍ය / සහකාර කොමසාරිස්වරුන් දෙදෙනෙක්, දෙපාර්තමේන්තුගත සහකාර කොමසාරිස්වරයකු, ගණකාධිකාරීවරයෙකු, නීති නිළධාරියකු, පරිපාලන නිලධාරී වරයෙකු, පරිවාස නිලධාරීන් දෙදෙනෙකු සහ ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරීන් දෙසිය තිස්හහතර දෙනෙකු ගෙන් සමන්විත මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරී මණ්ඩලයකගේ සහාය ඇතිව කොමසාරිස් විසින් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ කාර්ය භාරය ඉටු කිරීමේ වගකීම දරනු ලැබේ.

සංවිධාන ව්‍යූහයට අයත් වන අංශ :-

1. ආයතන හා පරිපාලන අංශය
2. ගිණුම් අංශය
3. පරිවාස අංශය
4. සංවර්ධන අංශය
5. පරත්ත ළමා පුහුණු හා උපදේශන සේවා ජාතික මධ්‍යස්ථානය

දෙපාර්තමේන්තුවේ සියළුම කාර්ය මණ්ඩලය උපරිම කැපවීමෙන් යුතුව කටයුතු කරනු ලැබේ. සමස්ත කාර්ය මණ්ඩලය 487 ක් වන අතර දැනට එය පහත සඳහන් පරිදි 430 දෙනෙකුගෙන් සමන්විත වේ.

| තනතුර | අනුමත සංඛ්‍යාව | දැනට සිටින සංඛ්‍යාව |
|---|---|---|
| කොමසාරිස් (ශ්‍රී ලං.ප.සේ.) | 01 | 01 |
| නියෝජ්‍ය / සහකාර කොමසාරිස් (ශ්‍රී ලං.ප.සේ.) | 02 | 01 |
| සහකාර කොමසාරිස් (දෙපාර්තමේන්තුමය) | 01 | - |
| ගණකාධිකාරී | 01 | 01 |
| නීති නිළධාරී | 01 | - |
| පරිපාලන නිලධාරී | 01 | - |
| භාෂා පරිවර්තක | 02 | 01 |
| පරිවාස නිලධාරී | 02 | 01 |
| සංඛ්‍යාලේඛන නිලධාරි | 01 | - |
| ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරී (CRPO) | 424 | 232 |
| ළමා හිමිකම් ප්‍රවර්ධන සහකාර (CRPA) | | 156 |
| සංවර්ධන නිලධාරි (ප්‍රධාන කාර්යාලය/පරත්ත) | 12 | 09 |
| මනෝ උපදේශක | 02 | - |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී | 01 | - |
| රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය | 14 | 09 |
| ලඝු ලේඛක | 01 | 01 |
| නොවිධිමත් අධ්‍යාපන උපදේශිකා | 01 | 01 |
| සහකාර වෝර්ඩන් | 03 | 03 |
| රියදුරු | 04 | 04 |
| කාර්යාල සේවක සේවය | 10 | 08 |
| අරක්කැමි | 02 | 02 |
| සනීපාරක්ෂක කම්කරු | 01 | - |
| මුලු එකතුව | 487 | 430 |

# 2. ආයතන හා පරිපාලන අංශය

## 2.1 ආයතන හා පරිපාලන අංශයේ මූලික කාර්යයභාරය

දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයට අදාල ආයතන කටයුතු

- පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවට අදාල නව කාර්ය මණ්ඩලය බඳවා ගැනීම, ස්ථාන මාරු කිරීම සහ විනය සම්බන්ධ කටයුතු
- දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලයේ කාර්යක්ෂමතා කඩඉම් සහ ප්‍රවීණතා පරීක්ෂණ පැවැත්වීම
- සියළුම කාර්ය මණ්ඩලයට ක්‍රමවත් පුහුණුවක් ලබා දීමට කටයුතු කිරීම

දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති වගකීම් ඉටු කිරීමේ දී අභ්‍යන්තර කාර්ය මණ්ඩලයේ පවත්නා දැනුම වඩාත් වර්ධනය කිරීමටත්, නව සංවර්ධන ක්‍රමෝපායන් හඳුන්වාදීමටත්, නව කාර්ය මණ්ඩලය බඳවා ගැනීම සහ කාර්ය මණ්ඩලයට අවශ්‍ය පුහුණුවීම් හා දැනුම ලබා දීමටත් කටයුතු කරන ලදි. ඒ අනුව,.

- දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාලවල පැවති පුරප්පාඩු සඳහා ළමා හිමිකම් ප්‍රවර්ධන සහකාරවරුන් 10 දෙනෙකු අළුතින් අනුයුක්ත කිරිමට කටයුතු කෙරිනි.
- ආයතන කටයුතු පිලිබඳ පුහුණුවීම් සඳහා නිළධාරීන් හත් දෙනෙකු ද, මූල්‍ය හා ගිණුම් කටයුතු පිලිබඳ පුහුණුවීම් සඳහා නිළධාරීන් පස් දෙනෙකු ද පුහුණුවීම් සඳහා සහභාගී වූ හ.
- දෙපාර්තමේන්තු නිළධාරීන් ගේ විෂය දැනුම වර්ධනය කිරීමේ අරමුණින් ඔවුන් ගේ පශ්චාත් උපාධි හා ඩිප්ලෝමා පාඨමාලා ගාස්තු වලින් 50% - 75 % දක්වා මුදලක් ගෙවීමට කටයුතු කෙරිනි. ඒ සඳහා රු. 366,875/- ක මුදලක් වෙන් කෙරුනි.

## 2.2 ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරීන්ගේ පුහුණු වැඩසටහන්

දිවයින පුරා සෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකටම අනුයුක්තව රාජකාරී ඉටු කරන ළමා හිමිකම් ප්‍රවර්ධන නිළධාරීන් / සහකාරවරුන් ගේ පුහුණු අවශ්‍යතා වෙනුවෙන් මෙම වැය ශීර්ෂයේ මුදල් භාවිතා කරනු ලබයි. වාර්ෂික සැලැස්ම අනුව 2015 වර්ෂයේ දී දෙපාර්තමේන්තු මානව සම්පත් සංවර්ධනය වෙනුවෙන් රු. මිලියන 01 ක් වෙන් කර ඇත. එම මුදලින් පහත සඳහන් පරිදි පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ලැබීය.

| වැඩ සටහන | | වැය කළ මුදල (රු) | සහභාගී වූ නිළධාරීන් ගණන |
|---|---|---|---|
| 01 | ළමා හිමිකම් ප්‍රවර්ධන නිළධාරීන් / පරිවාස නිළධාරීන් / ආයතනගත නිළධාරීන් ගේ ධාරිතා සංවර්ධන වැඩසටහන් | 8,20,995/- | 818 |
| 02 | දෙපාර්තමේන්තුව සඳහා සම්පත්දායක සංචිතයක් ස්ථාපිත කිරීම | 2,39,890/- | 56 |

## 3. ගිණුම් අංශය

දෙපාර්තමේන්තු අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා මූල්‍ය ප්‍රතිපාදන වාර්ෂිකව රාජ්‍ය අයවැය ලේඛනය මඟින් සපයා දෙනු ලබයි. 2015 වසරේදී 217 වැය ශීර්ෂය යටතේ සමාජ ආරක්ෂණය නැමැති අංශය යටතේ ප්‍රතිපාදන සපයා ඇත .

මෙම ප්‍රතිපාදන වෙන් කිරීම වැඩසටහන් දෙකකින් සමන්විතය.

1. මෙහෙයුම් වැඩසටහන
2. සංවර්ධන වැඩසටහන

ප්‍රතිපාදන පිළිබඳ සාරාංශය පහත දැක්වේ.

**වැඩසටහන් වශයෙන් ප්‍රතිපාදන / වියදම් සාරාංශය**

| | | ප්‍රතිපාදන (රු.) | වියදම (රු.) |
|---|---|---|---|
| **01.** මෙහෙයුම් වැඩසටහන ව්‍යාපෘති අංක 01 පරිපාලන හා ආයතනික සේවා | 1. පුනරාවර්තන වියදම් | 14,070,000.00 | 13,241,385.00 |
| | 2. මූලධන වියදම් | 860,000.00 | 716,010.00 |
| | **එකතුව** | **14,930,000.00** | **13,957,395.00** |
| **02.** සංවර්ධන වැඩසටහන ව්‍යාපෘති අංක 02 පරිවාස හා ළමාරක්ෂක සේවා | | ප්‍රතිපාදන (රු.) | වියදම (රු.) |
| | 1. පුනරාවර්තන වියදම් | 276,013,000.00 | 264,964,118.00 |
| | 2. මූලධන වියදම් | 32,257,000.00 | 28,106,353.00 |
| | **එකතුව** | **308,270,000.00** | **293,070,471.00** |

## මුල ධන වියදම් ප්‍රතිපාදන / වියදම් සාරාංශය

| | මුලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම | | මුලධන වත්කම් අත්පත් කරගැනීම | |
|---|---|---|---|---|
| **01.** මෙහෙයුම් වැඩසටහන ව්‍යාපෘති අංක 01 පරිපාලන හා ආයතනික සේවා | ප්‍රතිපාදන (රු.) | වියදම (රු.) | ප්‍රතිපාදන (රු.) | වියදම (රු.) |
| | 360,000.00 | 229,770.00 | 300,000.00 | 300,000.00 |
| **02.** සංවර්ධන වැඩසටහන ව්‍යාපෘති අංක 02 පරිවාස හා ළමාරක්ෂක සේවා | 760,000.00 | 398,980.00 | 1,497,000.00 | 1,433,433.00 |
| එකතුව | **1,120,000.00** | **628,750.00** | **1,797,000.00** | **1,733,433.00** |

## මුල ධන වියදම් ප්‍රතිපාදන / වියදම් සාරාංශය

| | හැකියා වර්ධනය | | ළමා නිවාස පුනරුත්තාපනය කිරීම | |
|---|---|---|---|---|
| **1.** මෙහෙයුම් වැඩසටහන ව්‍යාපෘති අංක 01 පරිපාලන හා | ප්‍රතිපාදන (රු.) | වියදම (රු.) | ප්‍රතිපාදන (රු.) | වියදම (රු.) |
| | 200,000.00 | 186,240.00 | --- | --- |
| **2.** සංවර්ධන වැඩසටහන ව්‍යාපෘති අංක 02 පරිවාස හා | 1,000,000.00 | 998,095.00 | 29,000,000.00 | 25,275,845.00 |
| එකතුව | **1,200,000.00** | **1,184,335.00** | **29,000,000.00** | **25,275,845.00** |

# 4. පරිවාස කටයුතු

පරිවාස සේවය යනුවෙන් අදහස් කරනුයේ ආයතනගත කිරීමක්, සිරගත කිරීමක්, වෙනත් මුල්‍යාමය දඩයකට හෝ වෙනත් දණ්ඩනයකට යටත් කිරීමකින් තොරව වරදකරුවෙකු පුනරුත්ථාපනය කිරීමයි. හුදෙක් එමඟින් අපේක්ෂා කරනුයේ පුද්ගලයා ජීවත්වන පරිසරයේම ඉන්නට ඉඩහැර පරිවාස නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ ඔහුට සමාජ විරෝධී ක්‍රියාවන්ගෙන් වැළකී නව ජීවිතයක් ගොඩනඟා ගැනීමට අවස්ථාව ලබාදීමයි.

1944 අංක 42 දරණ වරදකරුවන් පරිවාස භාරයේ තැබීමේ ආඥා පනතේ 03 වන වගන්තිය අනුව කිසියම් වරදක ස්වභාවය අනුවද වරදකරුවාගේ වයස, ස්ත්‍රී පුරුෂ භාවය සහ ඔහුගේ තත්වය යන කරුණු ද අධිකරණය මගින් සැලකිල්ලට ගෙන ඕනෑම පුද්ගලයෙකු වරදකරුවෙකු යැයි තීරණය කිරීමෙන් අනතුරුව ඔහුගේ කැමැත්ත ද ඇතිව ඕනෑම වරදක් සම්බන්ධයෙන් පරිවාස නියෝගයක් පැනවිය හැකිය.

මෙසේ පරිවාස භාරයට යොමු කිරීමෙන් වරදකරුට ආර්ථික හා සාමාජීය වශයෙන් ප්‍රතිලාභ හිමිවන අතරම එය මුළු මහත් සමාජයටම ද ප්‍රතිලාභ ගෙන දෙන්නකි. උදාහරණයක් ලෙසට යම් පුද්ගලයෙකු කිසියම් වරදක් කොට ඔහු සිරභාරයට හෝ වෙනත් දඬුවමකට ලක් කලහොත් එය ඔහුගේ පවුලට ආර්ථික හා සමාජීය වශයෙන් බලපානු ලබයි. එසේම රටට ද එවැනි අයෙකු නඩත්තු කිරීම සඳහා විශාල මුදලක් වැය කිරීමට සිදුවේ. එහෙත් එම පුද්ගලයා ජීවත්වන පරිසරය තුල තබා ඔහුගේ එදිනෙදා ජීවිතය යහපත් ආකාරයෙන් පවත්වාගෙන යාමට උපදෙස් පරිවාස සේවයෙන් හිමිවේ. එබැවින් මෙම පරිවාස සේවය ප්‍රජාපාදක පුනරුත්ථාපන ක්‍රියාවලියක් ලෙසට මුළු ලෝකයම පිළිගෙන ඇත.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනයට අනුව පරිවාස හා ළමාරක්ෂක සේවා විෂය පළාත් සභා වෙත පැවරී ඇතත් ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීමේ වගකීම මධ්‍යම රජය යටතේ දෙපාර්තමේන්තුව වෙත පැවරී තිබේ. එබැවින් පරිවාස සේවය විමධ්‍යගත වුවද අදාල ප්‍රතිපත්ති හා පනත් සංශෝධනය කිරීම මධ්‍යම රජයේ දෙපාර්තමේන්තුවේ කාර්යභාරයකි. ඒ අනුව පළාත් පරිවාස හා ළමාරක්ෂක දෙපාර්තමේන්තු සම්බන්ධීකරණය කරමින් පරිවාස සේවය වැඩිදියුණු කිරීමට කටයුතු කරන ලදි. දෙපාර්තමේන්තු ක්‍රියාකාරී සැලැස්ම යටතේ පළාත් දෙපාර්තමේන්තු සඳහා ප්‍රතිපාදන වෙන්කිරීම හා එකි ප්‍රගති සමාලෝචනය ද දෙපාර්තමේන්තුව විසින් ඉටුකරනු ලැබේ.

## 4.1 දරුකමට හදාවඩා ගැනීම්

1941 අංක 24 දරුකමට හදාවඩා ගැනීමේ ආඥා පනත යටතේ හදාවඩා ගැනීමට යෝජිත දරුවන්ගේ නීත්‍යානුකූල භාරකරු ලෙස ක්‍රියා කිරීමේ වගකීම දෙපාර්තමේන්තුව වෙත පැවරී තිබේ. මෙම කාර්යභාරය දේශීය හා විදේශීය වශයෙන් කොටස් දෙකකට බෙදේ. මෙයින් දේශීය හදාවඩා ගැනීම් පළාත් කොමසාරිස් විසින් කරනු ලබන අතර විදේශීය හදාවඩා ගැනීම් දෙපාර්තමේන්තුව විසින් ඉටුකරනු ලැබේ.

ශ්‍රී ලංකාවේ උපත ලබා එහෙත් වර්තමානයේ නොයෙක් විදේශ රටවල පුරවැසි භාවය ලබා සිටින්නවුන්, ශ්‍රී ලංකාවේ හා වෙනත් රටවල ද්විත්ව පුරවැසිභාවය හිමි අය හා තාවකාලිකව වෙනත් රටවල ජීවත් වන පුද්ගලයන් ද දරුවන් හදාවඩා ගැනීම සඳහා සිය ඉල්ලුම්පත් මධ්‍යම රජයේ මෙම දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබයි. එම ඉල්ලුම්කරුවන් දරුවන් රටින් බැහැරට ගෙන යන බැවින් ඔවුන් විදේශ හදාවඩා ගැනීමේ නීතිරීති අනුගමනය කලයුතු වේ.

තවද විදේශ රටවල ජීවත් වන ඇතැම් ඉල්ලුම්කරුවන් තම පවුලේ ඥාති දරුවන් හදාවඩා ගැනීමට ඉදිරිපත් වන අවස්ථා ඇති අතරම ඔවුන්ටද විදේශ හදාවඩා ගැනීමේ උපදෙස් පිළිපැදීමට සිදුවේ. එසේම විදේශිකයන්ද ශ්‍රී ලාංකික දරුවන් දරුකමට හදා වඩා ගැනීමට සිය ඉල්ලුම්පත්‍ර පරිවාස හා ළමාරක්ෂක

සේවා දෙපාර්තමේන්තුවට යොමු කරනු ලැබේ. අන්තර් ජාතික හේග් සම්මුතියේ හා ළමුන් දරුකමට හදා වඩා ගැනීමේ ආඥා පනතේ නීති ප්‍රතිපාදන මත එම ඉල්ලුම්කරුවන්ගේ ඉල්ලීම් වෙනුවෙන් කටයුතු කරනු ලැබේ. දේශීය ඉල්ලුම්කරුවන් නොමැති ළමුන් විදේශ හදා වඩා ගැනීම සඳහා යොමු කරනු ලැබේ.

## 4.2 විදේශ හදාවඩා ගැනීම් සඳහා වෙන් කළ දරුවන් - 2015

| අංක | විදේශීය රට | විදේශයන්හි සිටින ශ්‍රී ලාංකිකයන් විසින් හදාවඩා ගැනීමට ගත් දරුවන් සංඛ්‍යාව | විදේශ හදාවඩා ගැනීම් | හදාවඩා ගැනීමට දුන් මුළු දරුවන් ගණන |
|---|---|---|---|---|
| 01 | ඔස්ට්‍රේලියාව | 02 | - | 02 |
| 02 | කැනඩාව | 02 | - | 02 |
| 03 | ප්‍රංශය | 02 | 03 | 05 |
| 04 | ජර්මනිය | 01 | 02 | 03 |
| 05 | නෙදර්ලන්තය | - | 02 | 02 |
| 06 | ස්විට්සර්ලන්තය | 01 | 03 | 04 |
| 07 | නෝර්වේ | 01 | - | 01 |
| 08 | ඇමරිකා එක්සත් ජනපදය | 01 | -- | 01 |
| 09 | ඉතාලිය | - | 01 | 01 |
| 10 | බ්‍රිතාන්‍ය | 01 | - | 01 |
| 11 | සිංගප්පූරුව | 01 | - | 01 |
| එකතුව | | 12 | 11 | 23 |

# 5. සංවර්ධන අංශයේ කටයුතු

ළමයා කෙරෙහි විශේෂ රැකවරණය ව්‍යාප්ත කිරීමේ අවශ්‍යතාවය

- 1924 ළමා අයිතිවාසිකම් පිළිබඳ ජිනීවා ප්‍රකාශනයෙහි
- 1959 නොවැම්බර් මස 20 වන දින එක්සත් ජාතීන් විසින් සම්මත කරනු ලැබූ මානව අයිතිවාසිකම් පිළිබඳ ප්‍රකාශනයෙහි
- 1976 සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර ගිවිසුමෙහි
- 1976 ආර්ථික, සමාජ සහ සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර ගිවිසුමෙහි
- 1991 ළමා අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයෙහි

ළමයින්ගේ සුභසාධනය පිළිබඳ ප්‍රවේදිතාවක් ඇත්තාවූ විශේෂිත අනුයෝජිතායතනවල සහ ජාත්‍යන්තර සංවිධානවල ව්‍යවස්ථා සහ අදාළ සාධන පත්‍රවල පිළිගනු ලැබ ඇත්තා වූ ළමයාගේ අයිතිවාසිකම් පිළිබඳ ප්‍රකාශනයෙහි ප්‍රකාශ කොට ඇත.

ඒ අනුව ශ්‍රී ලංකාව තුළ ළමා අයිතිවාසිකම් පිළිගන්නා නීති සහ ප්‍රතිපත්ති සඳහා විධි විධාන සැලසිය යුතු හෙයින් ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය ප්‍රකාශයට පත් කර ඇත. එකී ප්‍රඥප්තියෙහි විධි විධාන ආවරණය වන පරිද්දෙන් දෙපාර්තමේන්තුව විසින් පහත දක්වා ඇති ආකාරයට සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කරන ලදි.

1. ජීවත්වීමට හා සංවර්ධනයට ඇති අයිතිවාසිකම් සහතික කිරිම යටතේ ක්‍රියාත්මක කරන ලද වැඩසටහන
   - සෙවණ සරණ කැපකරු මාපිය ක්‍රමය
   - අධ්‍යාපන ආධාර ලබා දීම
   - කැපකරු දෙගුරු ආධාර ක්‍රමය
   - නැණ දිරිය අධ්‍යාපන ආධාර ලබා දීම
   - හදිසි විපත් / වෛද්‍යාධාර / නිවුන් දරු ආධාර ක්‍රම
   - සෙනෙහස ආධාර ක්‍රමය
2. ළමා සහභාගීත්වය තහවුරු කිරීම යටතේ සිදු කරන ලද වැඩසටහන්
   - ළමා සමාජ හා ළමා සභා ස්ථාපිත කිරීම
   - ලෝක ළමා දිනය පිළිබඳ වැඩසටහන්
3. ප්‍රජා මූලික ළමා ආරක්ෂණය යටතේ සිදු කරන ලද වැඩසටහන්
   - ආදර්ශ ගම්මාන, සුභසාධක ගම්මාන හා ප්‍රජා මූලික ගම්මාන පිහිටුවීම
   - ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තිය පිළිබඳ මෙහෙයුම් කමිටු පැවැත්වීම
   - දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම
4. විකල්ප ආරක්ෂණය යටතේ සිදු කරන ලද වැඩසටහන්
   - අපයෝජනයට පත් දරුවන් පුනරුත්ථාපනය කිරීම
   - ආයතනගත ළමුන් සඳහා වෘත්තීය පුහුණුව ලබා දීම
   - ආයතනගත ළමුන්ගේ හැකියා ප්‍රවර්ධන වැඩසටහන් පැවැත්වීම

## 5.1 සෙවණ සරණ කැපකරු මාපිය ක්‍රමය

මෙම වැඩසටහන තුළින් ආර්ථික අපහසුතා මැද අධ්‍යාපනය ලබන දරුවන් සඳහා ඉගෙනුම් අවශ්‍යතා සපයා ගැනීමට අවශ්‍ය පරිදි මාසික ශිෂ්‍යත්වයක් ලබා දෙනු ඇත. මේ සඳහා මූල්‍ය දායකත්වය කැපකරු මාපියන් ගෙනි.

| **වර්ෂය** | **වැඩසටහන** | **භෞතික ප්‍රගතිය** | **මූල්‍ය ප්‍රගතිය ( මිලියන )** |
|---|---|---|---|
| 2015 | සෙවණ සරණ මාපිය කැපකරු ක්‍රමය | 137 | 1386000. 00 |

## 5.2 දරුවන්ගේ අධ්‍යාපන අයිතිය තහවුරු කිරීම

පාසැල් නොයන ළමුන් පාසැල් ගත කිරීම සඳහා වූ වැඩසටහනකි.

සෑම ළමයෙකුටම අධ්‍යාපනය ලබා ගැනීමට අයිතිවාසිකමක් ඇති අතරම ළමා සංවර්ධනයේ දී එය ඉතා වැදගත් සාධකයකි. ළමා කාලය තුල අධ්‍යාපන අවස්ථාව අහිමි වුවහොත් ළමුන්ගේ අනාගතය අඳුරු විය හැකිය. ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය අතරමග නතර කරන ළමුන් නිසා ළමා ශ්‍රමිකයන්, ළමා මව්වරුන් බිහිවීම හා විවිධ අපයෝජන වලට ළමුන් ලක්වන අවස්ථා බහුල වී ඇත. දෙමාපියන් අහිමිවීම, දෙමාපියන්ගේ නොදැනුවත්කම, නොසැළකිල්ල, මව විදේශගතවීම, ආර්ථික දුෂ්කරතා ආදී විවිධ කරුණු මත ළමුන්ගේ පාසැල් අධ්‍යාපනය අතරමග නතරවීම සිදුවනු ඇත.

පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලාංකික දරුවන්ගේ අධ්‍යාපන අයිතිය තහවුරු කිරීම තුලින් සදාචාරවත් දරු පරපුරක් බිහි කිරීම මෙම වැඩසටහනේ මූලික අරමුණ වේ. මෙහිදි ප්‍රවේශ 2 ක් යටතේ දරුවන්ට උපකාර කරනු ලැබේ. ඔවුන් නම්,

- පාසල් අධ්‍යාපනය ලබන වයසේ පසු වුවත් ආර්ථික දුෂ්කරතා නිසා අතරමග අධ්‍යාපනය නවතා දමා ඇති හෝ නතර විය හැකි දරුවන්
- විවිධ හේතූන් මත කඩින් කඩ පාසල් යන දරුවන් ය.

පාසල් නොයන දරුවන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් හඳුනාගෙන ඔවුන්ගේ පාසල් නොයාමට හේතුව සොයා බලා ඊට අවශ්‍ය කටයුතු සිදු කර ඔවුන්ව පාසල් ගත කිරීමත්, උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසමේ නිර්දේශ කරන ලද වතු ආශ්‍රිත ළමයින්ගේ අධ්‍යාපනය නඟාසිටුවීම සඳහා පාසල් උපකරණ ලබාදීමත් මෙමඟින් සිදු කරන ලදි.

මෙම වැඩසටහන අදියර කිහිපයකින් ක්‍රියාත්මක කරන ලදි.

- පාසල් උපකරණ ලබාදී ඔවුන් ශක්තිමත් කිරීම.
- අධ්‍යාපනය ලබාදීමේ වැදගත්කම ගැන දරුවන්, ගුරුවරුන්, දෙමාපියන් සඳහා දැනුවත් කිරීම වැඩසටහන් කිරීම.
- විදුහල්පතිවරුන්, ගුරුවරුන්, දෙමාපියන් නිලධාරීන් අතර දරුවාට යහපත් වන පරිදි මනා සම්බන්ධීකරණයක් ගොඩ නැගීම.

ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට අනුයුක්තව සිටින ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරීන් මගින් මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන ලදි.

**පාසැල් නොයන දරුවන් පාසැල් ගත කිරිමේ වැඩ සටහන**

| අනු අංකය | දිස්ත්‍රික්කය | ළමුන් ගණන | වැය වූ මුදල |
|---|---|---|---|
| 01 | මොණරාගල | 03 | 3,000.00 |
| 02 | මාතර | 115 | 175,500.00 |
| 03 | බදුල්ල | 25 | 25,000.00 |
| 04 | රත්නපුරය | 224 | 238,000.00 |
| 05 | අම්පාර | 25 | 35,000.00 |
| 06 | හම්බන්තොට | 147 | 181,500.00 |
| 07 | ගම්පහ | 51 | 67,000.00 |

| | | | |
|---|---|---|---|
| 08 | පුත්තලම | 59 | 78,000.00 |
| 09 | කළුතර | 09 | 14,000.00 |
| 10 | මාතලේ | 30 | 37,500.00 |
| 11 | කෑගල්ල | 69 | 72,500.00 |
| 12 | කුරුණෑගල | 73 | 101,500.00 |
| 13 | කොළඹ | 34 | 40,500.00 |
| 14 | මහනුවර | 134 | 190,000.00 |
| 15 | අනුරාධපුරය | 145 | 158,000.00 |
| 16 | පොලොන්නරුව | 28 | 29,000.00 |
| 17 | මඩකලපුව | 36 | 54,000.00 |
| | එකතුව | 1207 | 150,0000.00 |

## 5.3 කැපකරු දෙගුරු වැඩසටහන

තවදුරටත් දරුවන්ගේ අධ්‍යාපනික අවශ්‍යතා උදෙසා සහයෝගය දෙනු ලබන වැඩසටහනක් ලෙස කැපකරු දෙගුරු වැඩසටහන හඳුන්වා දිය හැකිය. මෙය මාසිකව ලබා දෙනු ලබන අධ්‍යාපනික ශිෂ්‍යත්ව ක්‍රමයක් ලෙස ක්‍රියාත්මක වේ. සුවිශේෂී අධ්‍යාපනික දක්ෂතා ඇති ආර්ථික වශයෙන් අගහිඟකම් මැද ජීවත්වන පාසල් දරුවන් මෙම වැඩසටහනේ ඉලක්ක කණ්ඩායම වේ. මොවුන්ගේ තෝරා ගැනීම හා යොමු කිරීම ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරීන් හරහා සිදු කරනු ලබන අතර, මාසයකට රු. 500/-ක හෝ රු. 750/- ක මුදලක් එක් දරුවෙකු වෙනුවෙන් ලබා දීමට කටයුතු කෙරේ.

**2015 වර්ෂයේ කැපකරු දෙගුරු ශිෂ්‍යාධාර ගෙවීම්**

| | දිස්ත්‍රික්කය | ළමුන් ගණන | මුදල |
|---|---|---|---|
| 1. | ගම්පහ | 92 | 512700 |
| 2. | කළුතර | 83 | 507500 |
| 3. | මොණරාගල | 83 | 442500 |
| 4. | කොළඹ | 82 | 457500 |
| 5. | බදුල්ල | 143 | 804000 |
| 6. | මාතර | 106 | 621000 |
| 7. | ගාල්ල | 127 | 783000 |
| 8. | හම්බන්තොට | 118 | 604500 |
| 9. | පුත්තලම | 54 | 319500 |
| 10. | කෑගල්ල | 92 | 505500 |
| 11. | කුරුණෑගල | 205 | 1156500 |
| 12. | රත්නපුරය | 95 | 552000 |

| | | | |
|---|---|---|---|
| 13. | මාතලේ | 67 | 372000 |
| 14. | අනුරාධපුරය | 160 | 927000 |
| 15. | පොලොන්නරුව | 13 | 84000 |
| 16. | නුවරඑළිය | 12 | 91500 |
| 17. | ත්‍රිකුණාමලය | 16 | 90000 |
| 18. | මහනුවර | 167 | 817500 |
| 19. | අම්පාර | 17 | 82500 |
| 20. | මඩකලපුව | 24 | 112500 |
| 21. | මුලතිව් | 3 | 13500 |
| 22. | යාපනය | 102 | 490500 |
| 23. | මන්නාරම | 2 | 12000 |
| 24. | වව්නියාව | 1 | 6000 |
| 25. | කිලිනොච්චිය | 1 | 6000 |
| | | **1865** | **10371200** |

මුළු වියදම 10,371,200

මුළු ප්‍රතිලාභීන් සංඛ්‍යාව 1865

## 5.4 නැණදිරිය අධ්‍යාපන ශිෂ්‍යත්ව ක්‍රමය

නැණ දිරිය වැඩසටහන සඳහා ද පෞද්ගලික අංශයේ මූල්‍ය දායකත්වය මත මෙම දෙපාර්තමේන්තුවේ කළමණාකරණ මණ්ඩලයක් මගින් විවිධ හේතු මත අධ්‍යාපනය අහිමි වීමේ අවදානමට පත් වී ඇති දරුවන් සඳහා මාසික ශිෂ්‍යත්වයක් පිරිනැමේ. මෙම වැඩසටහන ද සෙවණ සරණ කැපකරු මා පිය ක්‍රමය යටතේ උප ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කෙරේ. මෙමගින් එක් දරුවකුට මසකට රු. 1000/- ත් රු. 2000/- ත් අතර මුදලක් අනුග්‍රාහකයාගේ කැමැත්ත අනුව ලබා දෙනු ඇත.

**නැණදිරිය අධ්‍යාපන ශිෂ්‍යත්ව ක්‍රමය**

| **වර්ෂය** | **වැඩ සටහන** | **භෞතික ප්‍රගතිය** | **මූල්‍ය ප්‍රගතිය** |
|---|---|---|---|
| 2015 | නැණ දිරිය අධ්‍යාපන ආධාර වැඩ සටහන | 329 | 7086000.00 |

## 5.5 නිවුන් දරු ආධාර

අඩු ආදායම්ලාභි පවුල්වල නිවුන් දරුවන්ගේ සෞඛ්‍ය, පෝෂණය හා අනෙකුත් සුභසාධන කටයුතු වෙනුවෙන් මෙන්ම එම දරුවන් අවදානම් තත්වයන්ගෙන් ආරක්‍ෂා කර ගැනීම පිණිස ලබා දෙන ආධාර ක්‍රමයකි. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ලැබෙන ඉල්ලුම්පත්‍ර සඳහා අවශ්‍ය මුදල් සපයා දිම මෙහිදී සිදුවේ.

මේ යටතේ දරුවන් දෙදෙනෙකු සඳහා රු.7500/- ක්ද තුන් දෙනෙකු වෙනුවෙන් රු.15,000/- ක් ද සිව් දෙනෙකු සඳහා රු.20,000/- ක් ද පස් දෙනෙකු වෙනුවෙන් රු.25,000/- ක් ද වශයෙන් මුදල් ගෙවීම් සිදු කරයි.

සෑම ඉල්ලුම් කරුවෙකුටම එක් අවස්ථාවක් පමණක් මෙම ආධාර ක්‍රමය යටතේ ප්‍රතිලාභ ලබා ගැනීමට හැකියාව ලැබේ. ඒ අනුව වසරකට පවුල් 500 කට වැඩි පිරිසකට මෙමඟින් සහන සලසා දීමට අවස්ථාව උදා වී ඇත.

## 5.6 වෛද්‍ය ආධාර

අඩු ආදායම්ලාභී පවුල් වල දරුවන්ගේ සෞඛ්‍ය හා පෝෂණ ගැටළු සඳහා සහන සැපයීම වෙනුවෙන් මෙම ආධාර ක්‍රමය ක්‍රියාත්මක වේ. එසේම ආබාධිත දරුවන් වෙනුවෙන් ද උපකාර කිරීම මෙහිදී සිදු වේ. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ලැබෙන ඉල්ලුම්පත්‍ර සඳහා අවශ්‍ය මුදල් සපයා දීම මෙහිදී සිදු වේ.

මේ යටතේ වෛද්‍ය ප්‍රතිකාර, සැත්කම්, පෝෂණ කටයුතු, ශාරීරික දූර්වලතා වෙනුවෙන් භාවිතා කරන උපකරණ සඳහා ආධාර සැපයීම සිදු කරනු ලබයි. ප්‍රතිකාර හා පෝෂණ කටයුතු වෙනුවෙන් රු.5000/- මුදලක් ද, සැත්කම් සඳහා රු.10,000/- ක මුදලක් ද, උපකරණ සඳහා ඒවායේ මිල ගණන් අනුව විවිධ ප්‍රමාණයේ මුදල් ගෙවීම ද සිදු වේ. මෙම ගෙවීම් ප්‍රමාණයන් එම දරුවන්ගේ පවුල් වල විවිධ ස්වභාවයන් හා ඔවුන් මුහුණ පා ඇති දුෂ්කරතාවයන් මත වෙනස් වීමට ද පුළුවන.

සෑම ඉල්ලුම්කරුවෙකුටම එක් අවස්ථාවක් පමණක් මෙම ආධාර ක්‍රමය යටතේ ප්‍රතිලාභ ලබා ගැනීමට හැකියාව ලැබේ. ඒ අනුව වසරකට පවුල් 500 කට පමණ මෙමඟින් සහන සලසා දීමට අවස්ථාව ලැබී ඇත.

## 5.7 හදිසි විපත් ආධාර

හදිසියේ ඇති වන විපත් නිසා පවුල් වල අසරණ වන දරුවන්ගේ අධ්‍යාපන කටයුතු අඛණ්ඩව කරගෙන යාම සඳහා ලබා දෙන ආධාර ක්‍රමයකි. ක්‍ෂණිකව පරිසරයේ ඇතිවන ගංවතුර, සුළි සුළං, නාය යෑම්, නිවාස ගිනි ගැනීම්, වැනි තත්වයන් මත දුෂ්කරතාවයන්ට පත් වන දරුවන්ගේ සුභ සාධනය සැලසීම මෙහිදී සිදු වේ. එපමණක් ද නොව පවුල් තුළ දෙමව්පියන් මිය යෑම, දරුවන් අත්හැර දමා යෑම, දෙමව්පියන් හදිසි අනතුරු වලට රෝගාබාධ වලට ගොදුරු වීම, විදේශ ගතව නැවත නොපැමිණීම, දරුවන් තාවකාලික භාරකරුවන් අතට පත් වීම, එම භාරකරුවන් ශාරීරික හා මානසික දූර්වල අය වීම වැනි හේතූන් මත අසරණ වන දරුවන්ට පිහිට වීමට ද මෙම ආධාර ක්‍රමය උපකාරී වේ.

යම් ව්‍යසනකාරි තත්වයක දී දරුවන්ගේ පාසල් උපකරණ විනාශ වි ඇත්නම් ඒ වෙනුවෙන් එක් පවුලක් සඳහා රු. 5000/- ක ආධාරයක් ලබා දේ. එසේ වුව ද ඒ ඒ අවස්ථාවන්හි ඇති වන හානිදායක තත්වයේ ප්‍රබලතාවය මත ලබා දෙන ආධාර මුදල වෙනස් විමට පුළුවන. කුමන හෝ ව්‍යසනකාරි තත්වයක දී වුවත් දරුවන්ගේ අධ්‍යාපන කටයුතු කරගෙන යාමට දායක විම මෙහි ප්‍රධාන අරමුණ වේ. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ලැබෙන ඉල්ලුම්පත්‍ර සඳහා අවශ්‍ය මුදල් සපයා දීම මෙහි දී සිදු වේ.

## නිවුන් දරු ආධාර / වෛද්‍ය ආධාර / හදිසි විපත් ආධාර- 2015 වර්ෂය

| | | නිවුන් දරු ආධාර | | වෛද්‍ය ආධාර | | හදිසි විපත් ආධාර | |
|---|---|---|---|---|---|---|---|
| පළාත | දිස්ත්‍රික්කය | ළමයින් ගණන | මුදල | ළමයින් ගණන | මුදල | ළමයින් ගණන | මුදල |
| බස්නාහිර පළාත | කොළඹ | 37 | 150000 | 13 | 80000 | 01 | 5000 |
| | ගම්පහ | 62 | 255000 | 45 | 245000 | 01 | 15600 |
| | කළුතර | 102 | 385000 | 18 | 95000 | 01 | 5000 |
| මධ්‍යම පළාත | මහනුවර | 87 | 337500 | 26 | 125000 | 08 | 31000 |
| | මාතලේ | 32 | 120000 | 05 | 25000 | | - |
| | නුවරඑළිය | 24 | 90000 | 08 | 60000 | | - |
| වයඹ පළාත | කුරුණෑගල | 104 | 415000 | 41 | 335000 | 167 | 119500 |
| | පුත්තලම | 46 | 180000 | 05 | 25000 | 02 | 15000 |
| සබරගමු පළාත | රත්නපුර | 85 | 333000 | 32 | 200000 | 74 | 120000 |
| | කෑගල්ල | 25 | 97500 | 03 | 45000 | 02 | 15000 |
| දකුණු පළාත | ගාල්ල | 52 | 127500 | 14 | 85000 | - | - |
| | මාතර | 63 | 240000 | 29 | 212000 | 03 | 22700 |
| | හම්බන්තොට | 94 | 112500 | 09 | 45000 | 05 | 21000 |
| ඌව පළාත | බදුල්ල | 69 | 242500 | 17 | 85000 | 106 | 108000 |
| | මොණරාගල | 43 | 165000 | 29 | 177000 | 06 | 40000 |
| උතුරු මැද පළාත | අනුරාධපුරය | 27 | 97500 | 31 | 180000 | 04 | 15900 |
| | පොලොන්නරුව | 09 | 37500 | 13 | 95500 | 1189 | 700500 |
| නැගෙනහිර පළාත | අම්පාර | 16 | 60000 | 16 | 9000 | 02 | 9000 |
| | මඩකලපුව | 66 | 270000 | 53 | 295000 | 829 | 834000 |
| | ත්‍රිකුණාමලය | 24 | 82500 | 29 | 155000 | - | - |
| උතුරු පළාත | යාපනය | 61 | 232500 | 40 | 240000 | - | - |
| | මුලතිව් | 09 | 30000 | 02 | 15000 | - | - |
| | වව්නියාව | 18 | 67500 | 07 | 35000 | - | - |
| | කිලිනොච්චි | 18 | 67500 | - | - | - | - |
| | මන්නාරම | 10 | 37500 | 22 | 145000 | - | - |

## 5.8 සෙනෙහස ඉතිරි කිරීමේ ගිණුම

සුනාමි ව්‍යසනයෙන් දෙමව්පියන් දෙදෙනාම අහිමි අවු.18ට අඩු දරුවන් සඳහා ක්‍රියාත්මක වන වැඩසටහනකි. 2006 වර්ෂයේ මෙම වැඩසටහන ආරම්භ වූ අතර එහි දී ළමුන් 689 දෙනෙකු ඇතුළත් විය. 2015 දෙසැම්බර් මාසය වන විට මෙහි සිටින ළමුන් සංඛ්‍යාව 98 ක් විය. සෑම මසකම අවු.18 සම්පූර්ණ වන ළමුන් මෙම වැඩසටහනින් ඉවත් වේ.

මෙම දෙපාර්තමේන්තුව මහජන බැංකු මූලස්ථානය සමඟ එක්ව මෙම වැඩසටහන ක්‍රියාත්මක කරගෙන යනු ලබයි. සෑම මාසයකම අදාළ ළමුන් වෙනුවෙන් මෙම දෙපාර්තමේන්තුව මඟින් මහජන බැංකුව වෙත මුදල් (චෙක්පත් මඟින්) යැවීම සිදු කරයි.

වයස අවු.18 සම්පූර්ණ වන ළමුන් පිළිබඳව බැංකුව මඟින් දෙපාර්තමේන්තුව වෙත මාසිකව දැනුම් දෙනු ලබයි. බැංකුව මඟින් අදාළ ළමුන් වෙත මුදල් නිදහස් කර එම තොරතුරු දෙපාර්තමේන්තුව වෙත දැනුම් දීම සිදු වේ.

**2015 වර්ෂයේ සෙනෙහස ගිණුමේ මුදල් වැය වූ ආකාරය**

| අනු අංකය | මාසය | ළමුන් සංඛ්‍යාව | වැය වූ මුදල ( රු. ) |
|---|---|---|---|
| 01 | ජනවාරි | 116 | 174,000 |
| 02 | පෙබරවාරි | 116 | 174, 000 |
| 03 | මාර්තු | 115 | 172,500 |
| 04 | අප්‍රේල් | 111 | 166,500 |
| 05 | මැයි | 109 | 163,500 |
| 06 | ජුනි | 107 | 160,500 |
| 07 | ජූලි | 106 | 156,000 |
| 08 | අගෝස්තු | 104 | 156,000 |
| 09 | සැප්තැම්බර් | 102 | 153,000 |
| 10 | ඔක්තෝම්බර් | 98 | 147,000 |
| 11 | නොවැම්බර් | 96 | 144,000 |
| 12 | දෙසැම්බර් | 96 | 144,000 |

## 5.9 ළමා සමාජ හා ළමා සභාව පිහිටුවීමේ ව්‍යාපෘතිය

ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තියේ සඳහන්ව ඇති පරිදි 12,13,14 යන ව්‍යවස්ථාවන් මගින් ආවරණය වන ළමයින්ගේ සහභාගීත්ව අයිතිය තහවුරු කරමින් ළමයින් බලගැන්වීමේ ප්‍රධාන අරමුණින් යුතුව 2007 වර්ෂයේ ග්‍රාම නිලධාරී කොට්ඨාශ මට්ටමින් ළමා සමාජ පිහිටුවන ලදි. මෙසේ පිහිටුවා ගන්නා ලද ළමා සමාජ තුළින් දරුවන්ගේ සංවර්ධනයට, සාරධර්ම වර්ධනයට, කුසලතා වර්ධනයට අදාළ වැඩසටහන් රාශියක් සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකම ක්‍රියාත්මක කර ඇත.

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් පිහිටුවා ඇති ළමා සමාජ ඒකරාශී කරගනිමින් ප්‍රාදේශීය ළමා සභා ද, ප්‍රාදේශීය ළමා සභාවේ නිලධාරී මණ්ඩලයේ එකතුවෙන් දිස්ත්‍රික් ළමා සභා ද මේ වන විට පිහිටුවා ඇත. සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකම ප්‍රාදේශීය ළමා සභාවක් හා සෑම දිස්ත්‍රික්කයකම දිස්ත්‍රික් ළමා සභාවක් ද මේ වන විට පිහිටුවා ඇත. දිස්ත්‍රික් ළමා සභාවල එකතුවෙන් ජාතික ළමා සභාවක්ද ස්ථාපිත කර ඇත. ළමා සමාජ මගින් දරුවන්ට කුසලතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, ළමා සමාජ වල පුස්තකාල වලට පොත් ලබා දීම, යහගුණ ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත.

- ළමා සමාජ ළමා සභා වැඩ පිළිවෙළ සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම

2015 වර්ෂයේ මෙම ව්‍යාපෘතිය සඳහා වාර්ෂික ඇස්තමේන්තුව තුළ රු. මිලියන 3.4 ක මුදලක් වෙන් කරන ලදී. එම ප්‍රතිපාදන උක්ත වැඩසටහන සඳහා වැය කිරීම් කරමින් වැඩසටහනෙහි අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා කටයුතු කර ඇත.

- ප්‍රාදේශීය ළමා සභාව ක්‍රියාත්මක කිරීම සඳහා වර්ෂයේ මූල ප්‍රතිපාදන වෙන් කිරීම

ප්‍රාදේශීය ළමා සභාවට අයත් ළමුන් රැස් කර වර්ෂයේ ක්‍රියාත්මක වන වැඩසටහන් පිළිබඳව සහ ළමා සභාව රැස් කිරීම ත්‍රෛයි මාසිකව සිදුවේ. ප්‍රාදේශීය ළමා සභාව මඟින් සකස් කරනු ලබන වාර්ෂික සැලැස්ම යටතේ ඇස්තමේන්තුගත මුදල් ලබාදීම සඳහා මෙම වර්ෂයේ ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීය. එබැවින් ප්‍රාදේශීය ළමා සභා වෙත මුදල් වෙන් කෙරුනේ නැත. නමුත් ඉල්ලීම් අනුව විවිධ වැඩසටහන් සඳහා ප්‍රතිපාදන වෙන් කරන ලදී.

- ළමා සමාජ වල දරුවන්ගේ නිර්මාණශීලී හැකියාවන් වර්ධනය කිරීම

ළමා සමාජ වල දරුවන්ගේ නිර්මාණශීලී හැකියාවන් වර්ධනය කිරීම සඳහා විවිධ වැඩසටහන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමෙන් පවත්වන ලදි. ළමා සමාජ තව දුරටත් සක්‍රීය කරමින් දරුවන්ගේ සහභාගීත්වය, සහෝදරත්වය, කුසලතා වර්ධනය සඳහා මෙවැනි වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි.

- ළමා සමාජ / ළමා සභා දරුවන්ගේ ක්‍රීඩා කෞෂල්‍යා වර්ධනය තුළින් පෞරුෂත්ව සංවර්ධනය ඇති කිරීම

ළමා සමාජ / ළමා සභා දරුවන්ගේ ක්‍රීඩාව සඳහා සහභාගීත්වය වර්ධනය කිරීම සහ ක්‍රීඩා කෞෂල්‍යා දියුණු කිරීමේ අරමුණු ඇතිව ළමා සමාජ මඟින් මෙවැනි වැඩසටහන් ක්‍රියාත්මක කරයි. ක්‍රීඩාවේ ඇති වැදගත්කම සහ ඒ තුළින් පෞරුෂත්ව සංවර්ධනය ඇති කිරීම ද අරමුණු අතර වේ.

- ජාතික / ආගමික / සංස්කෘතික උත්සව පැවැත්වීම

සමාජය තුළින් ගිලිහී යන අවුරුදු චාරිත්‍ර වාරිත්‍ර හා ජන ක්‍රීඩා ඇතුළු සංස්කෘතිකාංග පිළිබඳ ළමුන්ට අවබෝධයක් ලබා දීම ඉදිරි අනාගතය සඳහා වැදගත් වේ. එම නිසා ළමා සමාජ දරුවන් සඳහා මෙවැනි අවුරුදු උත්සව පැවැත්වීම අරමුණු වේ.
එමෙන්ම ආගමික උත්සව, ජාතික උත්සව දින පිළිබඳ ඇති වැදගත්කම ළමුන්ට තහවුරු කර දීම සඳහා එවැනි දින උත්සව පැවැත්වීම ළමා සමාජ / ළමා සභා මඟින් සංවිධානය කෙරේ.

- පුස්තකාල සංවර්ධනය කිරීම

ළමා සමාජ මගින් පවත්වාගෙන යන පුස්තකාල වල අඩුපාඩු සම්පූර්ණ කර සංවර්ධනය කිරීම සඳහා දෙපාර්තමේන්තුව උදව් උපකාර කරයි. ළමුන්ගේ කියවීමේ රුචිය වර්ධනය කිරීම, දැනුම වර්ධනය කිරීම, ආකල්ප සංවර්ධනය යන අරමුණු පුස්තකාල ව්‍යාප්ත කිරීමෙන් සිදු වේ.

- අධ්‍යයන චාරිකා

ළමා සමාජ වල දරුවන්ගේ සහභාගීත්වය වර්ධනය කිරීම, ළමා සමාජ අතර අත්දැකීම් හුවමාරු කර ගැනීම, විනෝදය හා රසාස්වාදය ලබා දීම සහ දරුවන්ගේ අධ්‍යාපන කටයුතු සඳහා ප්‍රායෝගික අත්දැකීම් ලබා ගැනීමේ අරමුණු ඇතිව ළමා සමාජ දරුවන් අධ්‍යයන චාරිකා රැගෙන යාම සිදු කරයි.

- නායකත්ව පුහුණු වැඩමුළු / කඳවුරු පැවැත්වීම

දරුවන්ගේ පෞරුෂත්වය වර්ධනය, දැනුම කුසලතා ආකල්ප වර්ධනය, දරුවන් පරිසරයට සංවේදී හා ගවේෂණශීලී දරු පිරිසක් බවට පත් කිරීම, නායකත්ව කුසලතා වර්ධනයට මෙවැනි වැඩසටහන් ක්‍රියාත්මක කෙරේ.

- සෞඛ්‍යයට ඇති අයිතිය තහවුරු කිරීම

පෙර පාසල් හා පාසල් දරුවන්ගේ ඇති විවිධ ලෙඩ රෝග හඳුනා ගැනීමේ අරමුණ ඇතිව දුෂ්කර පළාත් වල ළමා සායන පැවැත්වීම සිදු කෙරේ. මෙමඟින් දරුවන් සඳහා,

i. යහපත් සෞඛ්‍යයක් පවත්වාගෙන යාමේ වැදගත්කම පිළිබඳ දෙමාපියන්ට අවබෝධයක් ලබා දේ.
ii. විශේෂඥ වෛද්‍ය සායන වලට ඉදිරිපත් වීමට හැකියාවක් නොමැති දරුවන්ට අවස්ථාවක් ලබා දීම.
iii. ශ්‍රවණ, දෘෂ්‍ය ආදියෙහි සුළු වශයෙන් ආබාධ සහිත දරුවන් හඳුනා ගෙන අවශ්‍ය මැදිහත්වීම් කිරීම.
iv. ඉතා කුඩා මැදිහත්වීමකින් සුව කල හැකි රෝග සහිත දරුවන් කල් තියා හඳුනා ගැනීමට හැකියාව ඇත.

- රස වින්දනාත්මක වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

පාසල් විෂය ධාරාවන් තුළ කොටු වී සිටින දරුවන් එළිමහනේ ප්‍රසාංගික අත්දැකීමක් කරා ගෙන යමින් ඔවුන්ගේ ගීත රසවින්දනාත්මක හැකියාවන් දියුණු කිරීම හා විවිධ සමාජ ගැටලු වලින් පීඩාවට පත්ව සිටින දරුවන්ට ගැටලු වලින් මඳකට හෝ නිදහස් වීම තුළින් සිත සැහැල්ලු කර ගැනීමට හැකියාවක් මෙවැනි වැඩසටහන් තුළින් සිදුවන නිසා ළමා සමාජ / ළමා සභා දරුවන් සඳහා මෙවැනි වැඩසටහන් සංවිධානය වැදගත් වේ.

| අනු අංකය | දිස්ත්‍රික්කය | 2015 වර්ෂයේ පිහිටු වූ ළමා සමාජ ගණන | දැනට පවතින මුළු ළමා සමාජ ගණන | වියදම් වූ මුදල රුපියල් |
|---|---|---|---|---|
| 01 | කොළඹ | 32 | 189 | 128,700.00 |
| 02 | කළුතර | 32 | 160 | 101,000.00 |
| 03 | ගම්පහ | 46 | 279 | 153,500.00 |
| 04 | මහනුවර | 62 | 370 | 155,000.00 |
| 05 | මාතලේ | 31 | 134 | 55,000.00 |
| 06 | නුවරඑළිය | 10 | 98 | 40,000.00 |
| 07 | ගාල්ල | 36 | 229 | 126,500.00 |
| 08 | මාතර | 48 | 194 | 95,000.00 |
| 09 | හම්බන්තොට | 16 | 159 | 80,000.00 |
| 10 | රත්නපුරය | 47 | 171 | 110,000.00 |
| 11 | කෑගල්ල | 17 | 141 | 75,000.00 |
| 12 | අනුරාධපුරය | 29 | 224 | 115,000.00 |
| 13 | පොලොන්නරුව | 09 | 64 | 40,000.00 |
| 14 | පුත්තලම | 10 | 158 | 90,000.00 |
| 15 | කුරුණෑගල | 123 | 509 | 215,000.00 |
| 16 | බදුල්ල | 19 | 131 | 95,000.00 |
| 17 | මොණරාගල | 13 | 163 | 85,000.00 |
| 18 | ත්‍රිකුණාමලය | 07 | 78 | 45,000.00 |
| 19 | අම්පාර | 14 | 104 | 100,000.00 |
| 20 | මඩකලපුව | 10 | 70 | 80,000.00 |
| 21 | යාපනය | 33 | 43 | 100,000.00 |
| 22 | කිලිනොච්චි | 08 | 08 | 30,000.00 |
| 23 | මන්නාරම | 03 | 21 | 35,000.00 |
| 24 | මුලතිව් | 22 | 22 | 10,000.00 |
| 25 | වවුනියා | - | 38 | 30,000.00 |

## 5.10 ආදර්ශ ළමා ගම්මාන වැඩසටහන

ප්‍රජා මූලික ළමා රක්ෂණ ක්‍රියාවලිය තහවුරු කිරීම සඳහා සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකින්ම තෝරා ගන්නා ලද ගම්මානයක ළමා අයිතීන් සුරක්ෂිත කිරීම සඳහා වන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා මෙම වැඩසටහන යටතේ ප්‍රතිපාදන වෙන් කර ඇත. මේ යටතේ විවිධ රාජ්‍ය නිළධාරීන්ගේ මැදිහත් වීම යටතේ එම ගම්මානය තුළ සෑම ළමයකුගේම සංවර්ධනය, පැවැත්ම , ආරක්ෂාව හා සහභාගිත්වය යන අයිතීන් සුරක්ෂිත කිරීමේ ලා වන වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතුය.

මේ සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ක්‍රියාත්මක කළ හැකි ව්‍යාපෘති වාර්තා ගෙන්වා ගත් අතර එකී අවශ්‍යතාවය මත ප්‍රතිපාදන වෙන් කරන ලදී. ඒ අනුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 311 ක් සඳහා ළමා හිමිකම් නිලධාරීන් 352 ක් වෙනුවෙන් රු.5000.00 බැගින් රු.176,0000.00 මුදලක් ලබා දෙන ලදී. ඊට අමතරව එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන්හි නිලධාරීන්ගේ ඉල්ලීම මත වැඩ සටහන් සඳහා පහත පරිදි ප්‍රතිපාදන මුදල් ලබා දෙන ලදී.

| අංකය | දිස්ත්‍රික්කය හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | වැඩ සටහන | වියදම (රු.) |
|---|---|---|---|
| 01 | අනුරාධපුරය - ගලෙන්බිඳුණුවැව | ළමා සංස්කෘතික වැඩ සටහන | 15500.00 |
| 02 | කුරුණෑගල - මාස්පොත | අවුරුදු වැඩ සටහන | 1500.00 |
| 03 | හම්බන්තොට - වීරකැටිය | පුස්තකාල පොත් ලබා දීම | 15000.00 |
| 04 | මහනුවර - නාවලපිටිය | පාසැල් බිත්තියේ චිත්‍ර නිර්මාණය කිරීම සඳහා | 5000.00 |
| 05 | බදුල්ල - රිදීමාලියැද්ද | ජංගම සේවා පොත් ලබා දීම | 144475.00 |
| 06 | කුරුණෑගල - මාස්පොත | දන්ත සායනය සඳහා | 6500.00 |
| 07 | මඩකලපුව - ඔඩ්ඩමාවඩි | ආදර්ශ ගම්මාන සංවර්ධන සැළසුම් පිළිබඳ වැඩ මුළුව | 14200.00 |
| 08 | මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | ළමා මිතුරු සම්පත් මධ්‍යස්ථානය විවෘත කිරීම | 77740.00 |
| 09 | කළුතර - බදුරලිය | ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩ සටහන | 38000.00 |
| 10 | ගාල්ල - ඉමදූව | ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩ සටහන | 32000.00 |
| 11 | ගම්පහ - බියගම | ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩ සටහන | 31625.00 |
| 12 | ගාල්ල - බෙන්තොට | ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩ සටහන | 49830.00 |
| 13 | කොළඹ - මාලඹේ කඩුවෙල | ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩ සටහන | 25161.00 |

## 5.11 ළමා අයිතිවාසිකම් පිළිබඳ මෙහෙයුම් කමිටු වැඩසටහන

ශ්‍රී ලංකාව විශ්ව ළමා ප්‍රඥප්තියට අත්සන් කිරීමෙන් පසු මෙරට දරුවන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම සඳහා ගනු ලැබූ ඉතා වැදගත් පියවරක් ලෙස මෙම වැඩසටහන හැඳින්විය හැක. මෙම මෙහෙයුම් කමිටු 2000 වසරේදී සමාජ සේවා අමාත්‍යාංශය මඟින් නිකුත් කරන ලද අංක MSS/3/4/161 දරණ චක්‍රලේඛය මඟින් පිහිටුවන ලද අතර, මෙම දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරන ලද අංක PCC/CROP/11/3/4 දරණ චක්‍රලේඛය මඟින් නැවත කෙටුම්පත් කරන ලදී. දිවයිනේ සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක්ම ආවරණය වන පරිදි ජාතික මට්ටමේ සිට ග්‍රාමීය මට්ටම දක්වා සියළු අවස්ථාවන් සඳහා මෙම මෙහෙයුම් කමිටු පිහිටුවන ලදී. ළමුන්ට ජීවත්වීම සඳහා සුවදායී පරිසරයක් නිර්මාණය කිරීම අරමුණු කරගෙන ක්‍රියාත්මක කරන ලද මෙම වැඩසටහනේදී කමිටු ශක්තිමත් කිරීම තුළ ළමා අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම සඳහා වූ ආදර්ශ ගම්මාන වැඩසටහන මෙන්ම, ළමා සහභාගීත්වය පුළුල් කිරීම සඳහා වූ ළමා සමාජ වැඩසටහනේ ද ක්‍රමික දියුණුවක් ඇති කිරීම ද මෙමඟින් බලාපොරොත්තු වූ දෙවන ප්‍රතිඵලයයි. ප්‍රාදේශීය මෙහෙයුම් කමිටු සඳහා එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකට රු. 3000 බැගින් රු. 939,000.00 ක් ද, දිස්ත්‍රික් සම්බන්ධීකරණ රැස්වීම් සඳහා එක් දිස්ත්‍රික්කයකට රු20,000/- බැගින් රු. 500,000.00 වශයෙන් ද වියදම් දරා ඇත.

| අනු අංකය | පළාත | ප්‍රාදේශීය මෙහෙයුම් කමිටු සඳහා වැය වූ මුදල ( රු.) |
|---|---|---|
| 01 | බස්නාහිර | 120,000.00 |
| 02 | මධ්‍යම | 108,000.00 |
| 03 | දකුණ | 141,000.00 |
| 04 | උතුර | 87,000.00 |
| 05 | නැගෙනහිර | 105,000.00 |
| 06 | වයඹ | 135,000.00 |
| 07 | උතුරු මැද | 81,000.00 |
| 08 | ඌව | 78,000.00 |
| 09 | සබරගමුව | 84,000.00 |

## 5.12 ළමා මිතුරු මධ්‍යස්ථාන

අවදානම් සහගත පවුල් පරිසරය තුළ හුදකලාවන දරුවන්ගේ ආරක්ෂාව තහවුරු කරමින් ඔවුන් තමන්ගේ විවේක කාලය ආරක්ෂිතව ගත කිරීමට මෙම මධ්‍යස්ථානයන් හි අවශ්‍ය රැකවරණය ලබා දේ. දෙමාපියන් දෙදෙනාම තම නිවෙස් වලින් බැහැරව කටයුතු කරන අවස්ථා වලදී දරුවන් ගේ ආරක්ෂාව මෙන්ම දැනුම, කුසලතාවයන් වර්ධනය කිරීම සඳහා අවශ්‍ය පහසුකම් ලබා දේ. මෙහිදී පුස්තකාල, ගෘහස්ථ ක්‍රීඩා මෙන්ම බාහිර ක්‍රීඩා ක්‍රියාකාරකම් වල නිරත වීමේ භාග්‍යය ද මොවුන්ට ලැබේ.

රුපියල් මිලියනයක ප්‍රතිපාදනයක් මේ සඳහා වෙන් වී ඇති අතර මෙම මධ්‍යස්ථාන ඉදි කිරීම සඳහා අවශ්‍ය පහසුකම් තිබෙන ස්ථානයන් අනුව ලැබෙන ඉල්ලීම් වලට අදාළව අවශ්‍ය ප්‍රතිපාදන ලබා දේ.

| අනු අංකය | පළාත | වැය වූ මුදල ( රු.) |
|---|---|---|
| 01 | වව්නියාව - වෙංගාලසෙට්ටිකුලම | 220,000.00 |
| 02 | මන්නාරම - නානාට්ටාන් | 250,000.00 |
| 03 | නුවරඑළිය - අඹගමුව කොරළය | 200,000.00 |
| 04 | ඔඩ්ඩමාවඩි | 32,186.00 |
| | එකතුව | 702,186.00 |

## 5.13 උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභා නිර්දේශ ක්‍රියාත්මක කිරීම

උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව මඟින් කරන ලද නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා වතු ආශ්‍රිතව ජීවත්වන ද්‍රවිඩ සම්භවයක් පවතින ජනතාවගේ දරුවන් හා දීර්ඝ කාලයක් පැවති යුධමය වාතාවරණය හේතු කොට ගෙන අවතැන් වූ දරුවන් ඉලක්ක කරගෙන මෙම වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදි. මෙම ප්‍රදේශවල ජීවත්වන දරුවන්ගේ මූලික අයිතිවාසිකම් ආරක්ෂා කරමින් සුරක්ෂිත ළමා වියක් නිර්මාණය කර දීම මෙම වැඩසටහනේ මූලික අරමුණ විය. දරුවන්ගේ පහසුකම් සැලසීමත්, ඔවුන් වෙනුවෙන් සතුටු මධ්‍යස්ථාන පිහිටුවීමත්, චිත්‍ර කලාව, සංගීතය, නැටුම් හා ක්‍රීඩා පැවැත්වීමත්, සාක්ෂරතාවය අහිමි වූ දරුවන් වෙනුවෙන් සාක්ෂරතා පන්ති පැවැත්වීමත් මෙහි ක්‍රියාකාරකම් විය. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවලින් ලද ඉල්ලීම් වලට අනුව ප්‍රතිපාදන ලබා දෙන ලදි.

යුද්ධය හා ඍජුවම සම්බන්ධ වූවන් දැනුවත් කිරීම සඳහා දිස්ත්‍රික් ලේකම් කොට්ඨාශ මට්ටමින් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් වැඩසටහන් සංවිධානය කරනු ලැබේ. නිවෙස් වලින් බැහැරව කටයුතු කරන අවස්ථා වල දී දරුවන් ගේ ආරක්ෂාව මෙන්ම දැනුම, කුසලතාවයන් වර්ධනය කිරීම සඳහා අවශ්‍ය පහසුකම් ලබා දේ. මෙහිදී පුස්තකාලයන් මෙන්ම ගෘහස්ථ ක්‍රිඩා මෙන්ම බාහිර ක්‍රීඩා ක්‍රියාකාරකම් වල නිරත වීමේ භාග්‍යය ද මොවුන්ට ලැබේ.

| අනු අංකය | වැඩ සටහනේ නම | ප්‍රගතිය |
|---|---|---|
| 01 | පුනරුත්ථාපනය කරන ලද ළමා සොල්දාදුවන් වෙනුවෙන් විශේෂ දැනුවත් කිරිමේ වැඩ සටහන් දිස්ත්‍රික්ක මට්ටමෙන් ක්‍රියාත්මක කිරිම | වැඩ සටහන් 25 |
| 02 | ස්වයං රැකියා ආධාර ලබා දිම සඳහා ව්‍යාපෘති | ව්‍යාපෘති 05 |

| | | |
|---|---|---|
| 03 | ළමා මිතුරු මධ්‍යස්ථාන ඉදි කිරීම හා එම මධ්‍යස්ථානවල දරුවන් සඳහා පුස්තකාල පහසුකම් මෙන්ම අභ්‍යන්තර හා බාහිර ක්‍රිකාකාරකම් සඳහා ක්‍රීඩා පහසුකම් ඇති කිරීම | මධ්‍යස්ථාන 04 |
| 04 | ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩ සටහන්පවත්වන ලද අතර අපයෝජනයන් සම්බන්ධයෙන් හා දරුවන්ගේ අයිතිවාසිකම් සම්බන්ධයෙන් විවිධ මාතෘකාවන් ඔස්සේ වැඩ සටහන් පවත්වන ලදී | වැඩ සටහන් 150 |
| 05 | ජංගම සේවාවන් පවත්වා දරුවන් සඳහා උප්පැන්න සහතික ලබා දීම හා දන්ත වෛද්‍ය සායන පැවැත්වීම | දරුවන් 25<br>සායන 02 |
| 06 | වතු ආශ්‍රිත පාසැල් සඳහා:<br>ළමා සමාජ පිහිටුවීම<br>එමගින් පුස්තකාල පහසුකම් ලබා දීම<br>සාක්ෂරතා පන්ති පැවැත්වීම<br>කඩින් කඩ පාසැල් යන හා නැවත පාසැල් ගත කළ දරුවන් සඳහා පාසැල් උපකරණ ලබා දීම | <br>ළමා සමාජ 80<br>පුස්තකාල 09<br>පන්ති 02<br>උපකරණ 2003 කට්ටල |
| 07 | විවිධ ආධාර වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම්:<br>නිවුන් දරු වෛද්‍ය ආධාර සහ හදිසි ප්‍රතිකාර<br>කැපකරු දෙගුරු ශිෂ්‍යත්ව<br>නැණ දිරිටය වැඩ සටහන<br>ග්‍රාමීය මෙහෙයුත් කමිටු පිහිටුවීම<br>ළමා සමාජ<br>ධාරිතා සංවර්ධන වැඩ සටහන පැවැත්වීම | <br>450<br>ශිෂ්‍යත්ව 108<br>වැඩ සටහන් 12<br>කමිටු 440<br>71<br>ළමා නිවාස 12 |

## 5.14 දැනුවත් කිරීමේ වැඩසටහන්

ළමා අපයෝජනයෙන් දරුවන් ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය දැනුම ලබා දීම වෙනුවෙන් සමාජයේ සිටින විවිධ සමාජ ව්‍යුහයන් දැනුවත් කිරීමේ මූලික අරමුණෙන් මෙම වැඩසටහන් වලට සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක්ම මෙන්ම දිස්ත්‍රික් ලේකම් කාර්යාල නියෝජනය කරමින් පවත්වනු ලැබේ.පාසැල් දරුවන් මෙන්ම සමාජ දරුවන් හා විවිධ කොටස් නියෝජනය කරමින් දරුවන් වෙනුවෙන් “ තටු සවිමත් සමනල් වියක් ” යන මාතෘකාව යටතේ වැඩසටහන් පවත්වනු ලැබේ. යොවුන් විය වගකීමෙන් ගත කළ යුතු බවත් අපචාරී ක්‍රියාවන් අවම කිරීම සඳහා දරුවන් ගේ දැනුවත්භාවය වැඩි දියුණු කරමින් හිංසාකාරී ක්‍රියාවන් ගෙන් දරුවන් ආරක්ෂා වන්නේ කෙසේද යන්නත් මේ තුළින් දැනුවත් කෙරේ.

මෙම වැඩසටහනේ දී මාතෘකාවන් 02 ක් ඔස්සේ දේශන පැවැත්වේ.

01. යොවුන් වියේ වෙනස්කම් හා පෞරුෂ සංවර්ධනය
02. නවීන තාක්ෂණය හා පරපුර

මෙයට සමගාමීව දිස්ත්‍රික් ලේකම් කාර්යාල මට්ටමින් “ අපේ සමනලුන් ගේ තටු සවිමත් කරමු.” යන මාතෘකාව ඔස්සේ සමාජයේ සිටින දෙමාපියන් හා වැඩිහිටි ප්‍රජාවත් දැනුවත් කරනු ලැබේ. සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක් සඳහා ම රු. 7500/- ප්‍රතිපාදන මුදලක් ලබා දී ඇති අතර දිස්ත්‍රික් ලේකම් කාර්යාල සඳහා ද රු. 7500/- ක ප්‍රතිපාදන මුදලක් ලබා දෙයි. ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ මට්ටමින් වැඩ සටහන් 347 ක් පවත්වන ලද අතර, එමගින් පුද්ගලයින් 34000 ක් දැනුවත් කරන ලදි ඒ සඳහා රු.39,94,660.00 වැය කර ඇත.

## 5.15 ආයතනගත නිළධාරීන් හා ළමුන් සඳහා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි ස්වේච්ඡා ළමා නිවාස සහ රජයේ ළමා නිවාස වල පුනරුත්ථාපන ක්‍රියාවලියට යොමු වී සිටින ළමුන්ගේ සුභසාධනය සඳහා මෙම ව්‍යාපෘතිය මඟින් මූල්‍ය සහය ලබා දෙනු ඇත. ළමා නිවාස වල සෘජු අධීක්ෂණය සහ නඩත්තුව පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව සතු වගකීමක් වුවද ජාතික දෙපාර්තමේන්තුව ද ළමා රැකවරණ ආයතන නඟා සිටුවීමේ ක්‍රියාදාමයට උරදෙමින් සිටී. එම ආයතනවල සිටින ළමුන්ගේ වෘත්තීය පුහුණුවීම් හා විවිධ කුසලතා වර්ධනය කිරීමේ කටයුතු සඳහා සහ එහි සේවය කරනු ලබන නිළධාරීන් පුහුණු කිරීම සඳහා මෙන්ම ළමා නිවාස වලට අවශ්‍ය භාණ්ඩ මිලදී ගැනීමට හා ළමා නිවාස අධීක්ෂණය වෙනුවෙන වර්ෂයකට විශාල මුදලක් වැය කරයි. පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තු කොමසාරිස්වරුන්ගේ ඉල්ලීම් හා නිර්දේශ මත මෙම මුදල් ලබා දී ඇත.

ඒ අනුව ආයතනගත නිලධාරීන් සඳහා වූ විශේෂ ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම වෙනුවෙන් වැය කර ඇති මුදල රු. 1,689,650.58 කි.

එමෙන්ම ආයතනගත දරුවන් වෙනුවෙන් වෘත්තීය පුහුණු ලබා දීම හා එම අවශ්‍යතා ලබා දීම සඳහා වැය කර ඇති මුදල රු1,866,968/- කි.

දරුවන් ගේ පසුවිපරම් කටයුතු හා ආරක්ෂණ සැළසුම් සකස් කිරීම වෙනුවෙන් රු.429,679/- ක් වැය කර ඇත.

## 5.16 පරත්ත ළමා පුහුණු හා උපදේශන සේවා ජාතික මධ්‍යස්ථානය

අපයෝජන සිදුවීමක් හෝ ළමුන් වෙනුවෙන් වන අයිතිවාසිකමක් උල්ලංඝණය වීමෙන් මානසික ගැටලු වලට බඳුන් වන ගැහැණු දරුවන්ගේ උපදේශන, අවශ්‍යතා සඳහා පිහිටුවන ලද ආයතනයක් ලෙස පරත්ත ළමා පුහුණු හා උපදේශන සේවා මධ්‍යස්ථානය දැක්විය හැකිය. මධ්‍යම රජය යටතේ පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව යටතේ පිහිටුවා ඇති එකම ළමා රැකවරණ ආයතනය මෙය වේ.

එකවර ළමයින් 20 ක් වෙනුවෙන් උපදේශනය, වෘත්තීය පුහුණුව, විධිමත් අධ්‍යාපනය නොලද අයට අවශ්‍ය නොවිධිමත් අධ්‍යාපනය මෙම මධ්‍යස්ථානයෙන් ලබා ගැනීමේ හැකියාව ඇත. ප්‍රාදේශීය මට්ටමේ රාජකාරී ඉටු කරන ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරීන්ගේ යොමු කිරීම මත හා අධිකරණ නියෝග මත යොමු වන දැරියන් පළාත් පරිවාස කොමසාරිස් ගේ නිර්දේශ මත මෙම ආයතනයේ පුහුණුව සඳහා ඇතුළත් කරනු ලැබේ.

සියළුම ගැහැණු දරුවන් නේවාසිකව රඳවා මාස 06 ක කාලසීමාවක් තුළ අදාළ උපදේශනය හා පුහුණුවීම ලබා දෙනු ඇත. එම කාලය තුල ළමයින්ගේ ආරක්ෂාව සඳහා සහකාර වෝර්ඩන් වරියන් තිදෙනෙක්, මුරකරුවන්, ආයතනයේ ස්ථාන භාර නිලධාරී මෙන්ම නොවිධිමත් අධ්‍යාපන උපදේශිකාවන් ද ක්‍රියා කරනු ලැබේ.

## 5.17 ළමා නිවාස ගුණාත්මක තත්වයෙන් ඉහළ නැංවීම

සියළුම පළාත්වල පිහිටි රජයේ හා ලියාපදිංචි ස්වේච්ඡා ළමා නිවාස වල ගුණාත්මක භාවය ඉහළ නැංවීම සඳහා පරිවාස හා ළමාරක්ෂක සේවා පළාත් කොමසාරිස්වරුන් විසින් හඳුනාගෙන ඉදිරිපත් කරනු ලබන සංවර්ධන යෝජනා සඳහා මූල්‍ය සහාය ලබා දීම ඉහත වැඩසටහන යටතේ සිදු කරනු ලබයි.

වාර්ෂිකව හඳුනා ගන්නා මෙම සංවර්ධන වැඩසටහන්වල අවශ්‍යතාවයන් තහවුරු කර ගැනීමෙන් අනතුරුව ඇස්තමේන්තුගත මුදලින් කොටසක් හෝ සම්පූර්ණ මුදල පළාත් කොමසාරිස් වෙත යොමු කරනු ලැබේ. ඒ අනුව නිසි පරිදි ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර අවසන් බිල්පත්වල පිටපත් සහ වියදම් වාර්තා සහිතව තොරතුරු ප්‍රධාන කාර්යාලය වෙත ගෙන්වා ගනු ලැබේ. මෙම ව්‍යාපෘතිවල සියලු ප්‍රගති හා විමසීම් කටයුතු ද පසුවිපරම් කටයුතු ද අධීක්‍ෂණය ද පළාත් පරිවාස හා ළමාරක්‍ෂක සේවා කොමසාරිස්වරුන් සතු කාර්යයක් වේ.

ඒ අනුව 2015 වර්ෂයේ දී මෙම වැය ශීර්ෂය යටතේ දිවයින පුරා පිහිටි ළමා නිවාස සහ පරත්ත ළමා පුහුණු හා උපදේශන මධ්‍යස්ථානය ගුණාත්මක තත්වයෙන් ඉහළ නැංවීම සඳහා හා අවශ්‍ය භාන්ඩ මිළදී ගැනිම වෙනුවෙන් රු.16,847,250.85 ක් වැය කරන ලදි.

## 5.18 ආයතනගත දරුවන්ගේ කුසලතා වර්ධනය

මේ සඳහා රුපියල් මිලියන 2.0 ක මුදලක් වෙන් වූ අතර කුසලතා වර්ධන වැඩසටහන් වෙනුවෙන් රු. 1574262.04/- මුදලක් වැය වී ඇත.

ළමා නිවාස අධීක්ෂණය වෙනුවෙන් වැය කරන ලද මුදල රු.1923625/- කි.

## 5.19 යුනිසෙෆ් ව්‍යාපෘතිය

මෙම දෙපාර්තමේන්තුව විසින් යුනිසෙෆ් ව්‍යාපාතිය හා ඒකාබද්ධව යුනිසෙෆ් ආයතනයේ මූල්‍ය අනුග්‍රහයෙන් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතිය සඳහා 2014/2015 වර්ෂ දෙක වෙනුවෙන් රු. මිලියන 5.5 ක මුදලක් වැය කිරීමට අනුමත වී තිබුණි.

එම මුදලින් 2014 වර්ෂයට අදාල ක්‍රියාකාරකම් ඉටු කිරිමෙන් අනතුරුව රුපියල් මිලියන 4,294,385/-ක මුදලක් 2015 වර්ෂය තුළ ක්‍රියාත්මක කළයුතු, කාර්යයන් වෙනුවෙන් ඉතිරි විය. 2014 වර්ෂයේ ඉටු කළ ක්‍රියාකාරකම් වල දිගුවක් ලෙස පහත සඳහන් පරිදි එම මුදල වැය කරණ ලදි.

| අනු අංකය | ව්‍යාපෘතිය | වැය කළ මුදල ( රු. ) |
|---|---|---|
| 01 | සමීක්ෂණ | 824,190.00 |
| 02 | ළමාරක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාව | 1,890,000.00 |
| 03 | දත්ත පද්ධතිය සකස් කිරීම | 674,762.66 |
| 04 | මෙහෙයුම් කටයුතු හා වෙනත් | 865,432.34 |
| | එකතුව | 4,294,385.00 |

## 5.20 ළමා අපයෝජන පැමිණිලි පිළිබඳ තොරතුරු

ළමා අපයෝජන සම්බන්ධයෙන් 2015 වර්ෂයේ දී මෙම දෙපාර්තමේන්තුව වෙත නාමිකව, නිර්නාමිකව, ලිඛිතව සහ දුරකථනයෙන් පැමිණිලි 11084 ක් ලැබුණු අතර, එම සියළුම පැමිණිලි ඉදිරි විමර්ශන කටයුතු සඳහා සහ නීතිමය කටයුතු සඳහා විවිධ ආයතන වෙත යොමු කර අවශ්‍ය කටයුතු සිදු කර ඇත. මෙහි දී පැමිණිල්ලේ ස්වරූපය අනුව ප්‍රාදේශීය ලේකම්වරු හරහා ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරීන් වෙත ද, පොලිස් ළමා හා කාන්තා කාර්යාංශය වෙත ද, අදාළ පොලිස් ස්ථාන වලට ද, කම්කරු දෙපාර්තමේන්තුව, පළාත් පරිවාස දෙපාර්තමේන්තු , විදේශ සේවා නියුක්ති කාර්යාංශය වෙත ද යොමු කර ඇත. ඉතිරි පැමිණිලි සඳහා අවශ්‍ය උපදෙස් දුරකතයෙන් ලබා දෙන ලදී.

## 5.21 2015 ලෝක ළමා දින සැමරිම

සෑම වර්ෂයකම ඔක්තෝම්බර් 01 දිනට යෙදෙන ලෝක ළමා දිනය සැමරීම අරමුණු කර ගනිමින් දෙපාර්තමේන්තුව වැඩසටහන් ගණනාවක් සංවිධානය කරන ලදී. ඒ අතර ළමා සමාජ දරුවන් සඳහා පවත්වනු ලැබූ පද්‍ය රචනා, ගද්‍ය රචනා, කෙටිකතා තරඟ පවත්වන ලදි. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් සෑම අංශයකින්ම තෝරා ගත් හොඳම නිර්මාණ දිස්ත්‍රික් මට්ටටමේ තරඟයට ඉදිරිපත් කර දිස්ත්‍රික්කයේ ජයග්‍රාහී නිර්මාණ ජාතික තරඟය සඳහා ඉදිරිපත් කරන ලදී. දිස්ත්‍රික් මට්ටමේ තරඟ විනිශ්චය වෙනුවෙන් , දිස්ත්‍රික් මට්ටමේ ජයග්‍රාහකයන් සඳහා සහතික පත්‍ර මුද්‍රණය හා වෙනත් වියදම් වෙනුවෙන් රු. 254,500 වියදම් කෙරුනි.

ලාංකික සමාජයේ සමස්ත දරුවන් ඉලක්ක කර ගනිමින් ඔවුන්ගේ සෞන්දර්යාත්මක කුසලතා ඔප් නැජවීමේ අරමුණෙන් පරිකල්පන චිත්‍ර තරඟය ද සංවිධානය කරන ලදී. ප්‍රාථමික, කණිෂ්ඨ හා ජ්‍යෙෂ්ඨ යන ඉසව් යටතේ මෙය සංවිධානය කරන ලදී. මෙම තරඟය වෙනුවෙන් 2015 වර්ෂයේදී 1,049,957.20 වියදම් කෙරුනි.

එමෙන්ම මීට සමගාමීව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ හා දිස්ත්‍රික් මට්ටමින් දරුවන් මෙන්ම ප්‍රජාව අරමුණු කර ගනිමින් නායකත්ව පුහුණු, නාට්‍ය වැඩමුළු, රසවින්දන වැඩසටහන්, ළමා කඳවුරු, දැනුවත් කිරීමේ වැඩසටහන් ආදී ක්‍රියාකාරකම් ලෝක ළමා දිනය වෙනුවෙන් ක්‍රියාත්මක කරන ලදී.

ලෝක ළමා දිනය සමගාමීව බදුල්ල තලාවේ කනිෂ්ඨ විද්‍යාලයට පොත් ලබාදීම වෙනුවෙන් රු. 35,064.00 වියදම් කෙරුනි.

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ හා දිස්ත්‍රික් මට්ටමින් රු. 2,142,227/- හා ලෝක ළමා දින ජාතික උත්සවය වෙනුවෙන් රු. 202,118/- මේ සඳහා වියදම් කෙරුනි.

ළමා අපයෝජන පිළිබඳ තොරතුරු වාර්තාව සාරාංශය **2015**

| අනු අංකය | ළමා අපයෝජන පිළිබඳව වාර්තා වූ පැමිණිල්ලේ ස්වභාවය | පැමිණිල්ලේ මූලාශ්‍රය (සංඛ්‍යාත්මකව) | | | | මුළු පැමිණිලි සංඛ්‍යාව | වර්තමානතත්වය සංඛ්‍යාත්මකව | | | වෙනත් කරුණු |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | ප්‍රධාන කාර්යාලය මගින් | ජාතික ළමාරක්ෂක අධිකාරිය හරහා (1929) | දුරකථන ඇමතුම් මගින් | වෙනත් | | පූර්ණකාලීන විසඳුම් ලබා දීම | කෙටිකාලීන විසඳුම් ලබාදීම | වෙනත් ආයතන වෙත යොමු කිරීම | |
| 1 | පාසැල් නොයැවීම | 59 | 502 | 1155 | 4679 | 6395 | 3268 | 2244 | 818 | 65 |
| 2 | බාල වයස් විවාහ/බාල වයස් ගැබ් ගැනීම් | 07 | 22 | 136 | 341 | 506 | 52 | 168 | 277 | 09 |
| 3 | කායික දණ්ඩනය | 22 | 75 | 198 | 315 | 610 | 354 | 114 | 139 | 03 |
| 4 | මානසික අපයෝජනය | 41 | 58 | 231 | 632 | 962 | 365 | 428 | 169 | 00 |
| 5 | ළමා ලිංගික අපයෝජනය | 07 | 29 | 158 | 330 | 524 | 93 | 95 | 332 | 04 |
| 6 | නොසළකා හැරීම | 17 | 65 | 290 | 793 | 1165 | 445 | 582 | 134 | 04 |
| 7 | ළමා මෙහෙකාර සේවය | 03 | 27 | 54 | 82 | 166 | 105 | 29 | 32 | 00 |
| 8 | වෙනත් (සඳහන් කරන්න) | 15 | 64 | 218 | 459 | 756 | 386 | 169 | 192 | 09 |
| | මුළු සංඛ්‍යාව | 171 | 842 | 2440 | 7631 | 11084 | 5068 | 3829 | 2093 | 94 |

## 5.22 ආරක්ෂණ සැලසුම් සකස් කිරීම

අවදානම් තත්වයේ පසුවන දරුවන් සඳහා දිගු කාලීනව ආරක්ෂාව සහතික කිරීමේ වැඩ පිළිවෙල ආරක්ෂණ සැලසුම් සකස් කිරීමයි. ළමා ආරක්ෂාව සහතික කිරීමේ ශිල්පීය ක්‍රමවේදයක් ලෙස මෙහි අවශ්‍යතාව මතු වන්නේ 2011 වර්ෂයේ දී දීප ව්‍යාප්තව කරන ලද අවදානම් ළමුන් හඳුනා ගැනීම පිළිබඳ වූ සමීක්ෂණය තුළින් විශාල ළමුන් සංඛ්‍යාවක් හඳුනා ගැනීමට ලැබීම හේතුවෙනි.

මේ ආකාරයට හඳුනා ගන්නා ලද දරුවන්ගේ අවදානම් තත්වයන් විවිධ විය. ඔවුන්ගේ අවදානම් තත්වයට අනුව එම අවදානම් තත්වයෙන් අහෝසි කර ආරක්ෂාව සහතික කිරීම සඳහා ආරක්ෂණ සැලසුම් සකස් කිරීම සිදු කරයි. එය කෙටි කාලීනව මෙන්ම වසර කීපයක් පුරා දිගු කාලීනවද ක්‍රියාත්මක කිරීමට සිදුවන අතර ළමා හිමිකම් ප්‍රවර්ධන නිළධාරීන් හා ළමා හිමිකම් ප්‍රවර්ධන සහකාරවරුන් පසු විපරම් කිරීම සිදු කරනු ලබයි.

මෙම ආරක්ෂණ සැලසුම් සකස් කිරීමේ සිට ක්‍රියාත්මක කිරීම හා ඇගැයීම ඇතුළු සියළු කටයුතු වලදී වෙනත් ක්ෂේත්‍ර නිලධාරීන් ගේ සහය ද ලබා ගනු ලැබේ. ළමා ආරක්ෂාව තහවුරු කිරීමේ දී තනි පුද්ගලයකුට වඩා ඒකාබද්ධ ප්‍රවේශයක් තුළ ක්‍රියා කිරීමේ ඇති වැදගත්කම මේ තුළින් අවධාරණය කර ඇත.

මෙම ආරක්ෂණ සැළසුම් සකස් කිරීම තුළින් දරුවාට ආරක්ෂාව සහ සංවර්ධනය ලැබෙන අතරම පවුල නගා සිටුවීම ද සිදුවෙයි. විශේෂයෙන් දරුවන්ගේ පෝෂණය හා සංවර්ධනයට අවශ්‍ය පවුලේ ආදායම් මාර්ග වැඩි දියුණු කිරීම සනීපාරක්ෂක පහසුකම් වර්ධනය මෙන්ම අධ්‍යාපන තත්ත්වය නගා සිටුවීම සඳහා ද අවශ්‍ය පහසුකම් සපයා දීමට මේ තුළින් හැකියාව ලැබී ඇත.

## 5.23 දකුණු ආසියානු කලාපීය දරුවන්ට එරෙහි හිංසනය වැලැක්වීම සඳහා වන සංවිධානයට අනුබද්ධිත ව්‍යාපෘතිය - (SAIEVAC)

මූල්‍ය අනුග්‍රහය - සාර්ක් සංවර්ධන අරමුදල

දකුණු ආසියානු කලාපීය දරුවන්ට එරෙහි හිංසනය වැලැක්වීම සඳහා වන සංවිධානයේ මූලිකත්වයෙන් කලාපීය වශයෙන් දරුවන් සඳහා හිංසනයෙන් තොර පරිසරයන් නිර්මාණය කිරීමේ අරමුණින් යුතුව සාර්ක් සංවර්ධන අරමුදලෙහි මූල්‍ය අනුග්‍රහය යටතේ ශ්‍රී ලංකාව වෙත 2013 වර්ෂයේ අගභාගයේ දී ව්‍යාපෘතියක් ලබා දුන් අතර ජාතික ළමාරක්ෂක අධිකාරිය විසින් එම ව්‍යාපෘතිය 2015 අප්‍රේල් දක්වා ක්‍රියාත්මක කරන ලදී. 2015 අප්‍රේල් මස මෙම ව්‍යාපෘතිය සහ දකැණු ආසියානු කලාපීය දරුවන්ට එරෙහි හිංසනය වැලැක්වීම සඳහා වන සංවිධානයේ දේශීය සම්බන්ධීකාරත්වය පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවට පැවරිණි. ඒ අනුව මෙතෙක් ක්‍රියාත්මක කර නොතිබූ ඇතැම් ක්‍රියාකාරකම් සඳහා පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව විසින් නව වැඩ සටහන් යෝජනා කර 2015 ජූලි මස සාර්ක් අරමුදලෙහි අනුමැතිය ලබා ගන්නා ලදී. ඒ අනුව ක්‍රියාත්මක කිරීමට යෝජිත වැඩ සටහන් සඳහා ළමා කටයුතු පිළිබඳ රාජ්‍ය

අමාත්‍යාංශය විසින් අදාල මුදල් 2015 සැප්තැම්බර් මස ලබා දුණි. ඒ අනුව ක්‍රියාත්මක කළ වැඩ සටහන් පහත පරිදි වේ.

- ළමා සහභාගිත්වය පිළිබඳ මාර්ගෝපදේශය මුද්‍රණය කිරීම සහ බෙදා හැරීම
- දකුණු ආසියානු කලාපීය දරුවන්ට එරෙහි හිංසනය වැලැක්වීම සඳහා වන සංවිධානයට සම්බන්ධ ජාතික ක්‍රියාකාරී සම්බන්ධීකරණ කණ්ඩායමේ අනු ව්‍යාපෘති යෝජනාවට අනුව ඒ සඳහා අත් පත්‍රිකා සහ පෝසටර්ස් මුද්‍රණය කිරීම
- ළමා සහභාගීත්වය ශක්තිමත් කිරීම සඳහා පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරනු ලබන ළමා සභා/ළමා සමාජ වැඩ සටහන සඳහා පෝස්ටර්ස් මුද්‍රණය කිරීම

මෙම ව්‍යාපෘතියට අදාල ප්‍රගතිය:

දෙපාර්තමේන්තුව වෙත ලැබුණු මුදල රු. 7,630,060.61

උක්ත වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමේ දී වියදම රු. 4,244,464.35